සැ. යු. - මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2009/2010 වර්ෂය සඳහා කොළඹ මහාධිකරණයේ ජූරි සභිකයින්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,667 - 2010 අගෝස්තු මස 13 වැනි සිකුරාදා - 2010.08.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1476 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1477 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1430 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 අගෝස්තු මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 අගෝස්තු මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1475- B 79892—3,370 (2010/08)
A1–

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2010 අංක 111

DIRF/RECT/244/AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බළ හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරීන් 2010 ජනවාරි මස 17 වැනි දින සිට පහත දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා පිළිවෙල අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බළ හමුදාවේ දෙවැනි ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කරනු ලැබීම සහ එදින සිට ඔවුන්ගේ නම් ඉදිරියෙන් පෙන්වා ඇති රෙජිමේන්තුව/බළකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

සී/57038 කෙනි ගරිහින්ගේ දසුන් ප්‍රියදර්ශන ගරුසිංහ, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය ;
සී/57043 කෙනි මනික්කුගේ නුවන් රන්දික චන්ද්‍රතිලක සිල්වා, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය ;
සී/57026 කෙනි තෙන්නකෝන් මුදියන්සේලාගේ අසංක සම්පත් සෙනෙවිරත්න, ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය ;
සී/57015 කෙනි ලියන ලේකමලාගේ ප්‍රදීප් කුමාර, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ;

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 ජූලි මස 19 වැනි දින,
කොළඹ දී ය.

08-299

---

2010 අංක 112

## ජාතික ශිෂ්‍යභට බළකාය

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

2009 ජනවාරි මස 01 වැනි දින සිට ලුතිතන් කර්නල් වශයෙන් ඃ

නි/3133 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) ඩබ්එම්එම්ජ්බී වෙළගෙදර ;
නි/3044 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) ඩබ්එම් ධනපාල ;
නි/3072 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) එච්ජ්වයිඑස් හෙට්ටිආරච්චි (ගැ) ;
නි/3081 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) ඩීපී විජයසිරි ;
නි/3121 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) එස්එස්ජී ද සිල්වා ;
නි/3134 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) ජීඑම්එම් පෙරේරා ;
නි/3142 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) එන්ජ්එම් පියරත්න ;
නි/3157 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) එස්එම්ජී සමරකෝන් ;
නි/3130 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) ඩී ද සිල්වා ;
නි/3139 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) ඒයූ දයානන්ද ;
නි/3150 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) පීජ්එම් ගුණසේකර.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

කොළඹ දී ය.

08-302

---

2010 අංක 113

## ජාතික ශිෂ්‍යභට බළකාය

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

2009 දෙසැම්බර් මස 31 වැනි දින සිට මේජර් වශයෙන් ඃ

නි/3074 කපිතන් (තාවකාලික මේජර්) එච්කේජ් දයාකාන්ති (ගැ) ;
නි/3526 කපිතන් (තාවකාලික මේජර්) කේඩී ද සිල්වා ;
නි/4160 කපිතන් (තාවකාලික මේජර්) එම්එම්ආර් ජයන්ත ;
නි/4303 කපිතන් (තාවකාලික මේජර්) ආර්එම්එස් බණ්ඩාර ;
නි/4512 කපිතන් (තාවකාලික මේජර්) අයිඑම්කේ ඉලංගන්තිලක ;
නි/4521 කපිතන් (තාවකාලික මේජර්) එම්ජ්ඩීඑස් කුලරත්න ;
නි/4522 කපිතන් (තාවකාලික මේජර්) ඊඑච්ආර් නන්දසේන ;
නි/4534 කපිතන් (තාවකාලික මේජර්) ඩබ්එම්එස්බී වීරසේකර ;
නි/4538 කපිතන් (තාවකාලික මේජර්) එම්ඩබ්ඩීඑම්පීකේ බණ්ඩාර (ගැ) ;
නි/4539 කපිතන් (තාවකාලික මේජර්) ආර්ජ්එල්එස් ප්‍රියදර්ශන ;
නි/4544 කපිතන් (තාවකාලික මේජර්) එස්ඩී දිසානායක ;
නි/4546 කපිතන් (තාවකාලික මේජර්) කේජ්ඩබ් කොඩිසිංහ ;
නි/4552 කපිතන් (තාවකාලික මේජර්) බීඩීඑස් රාජරත්න ;
නි/4554 කපිතන් (තාවකාලික මේජර්) එම් විජේසේකර ;
නි/4568 කපිතන් (තාවකාලික මේජර්) ආර්ආර්ඩීඑස් කරුණාතිලක (ගැ) ;
නි/4573 කපිතන් (තාවකාලික මේජර්) එස්ජ්බී ලියනගේ ;
නි/4577 කපිතන් (තාවකාලික මේජර්) එච්පී මෙවන්තිස්ස ;
නි/4595 කපිතන් (තාවකාලික මේජර්) කේ වික්‍රමරත්න ;
නි/4596 කපිතන් (තාවකාලික මේජර්) ඊඑම්කේ ජයසුන්දර ;
නි/4549 කපිතන් (තාවකාලික මේජර්) ඩීඑස්එස් ගුණසේකර.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

කොළඹ දී ය.

08-301

2010 අංක 114

**ජාතික ශිෂ්‍යභට බළකාය**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

2009 දෙසැම්බර් මස 31 වැනි දින සිට කපිතන් වශයෙන් :

නි/3461 ලුතිතන් (තාවකාලික කපිතන්) ඒඑච්ඒඑච් රණසිංහ (ගැ) ;
නි/3523 ලුතිතන් (තාවකාලික කපිතන්) පීඩබ්කේ කුමාරසිරි ;
නි/3674 ලුතිතන් (තාවකාලික කපිතන්) ටීඩබ් මහින්දරත්න ;
නි/3799 ලුතිතන් (තාවකාලික කපිතන්) එස්එම්ජී ජයතිලක ;
නි/3990 ලුතිතන් (තාවකාලික කපිතන්) ජීආර්ඩී අල්විස් ;
නි/4126 ලුතිතන් (තාවකාලික කපිතන්) ආර්පීඅයි පුෂ්පකුමාර ;
නි/4176 ලුතිතන් (තාවකාලික කපිතන්) එස්පීඑස්කේ ධර්මසේන ;
නි/4212 ලුතිතන් (තාවකාලික කපිතන්) එස්කේජී අජිත් කුමාර ;
නි/4541 ලුතිතන් (තාවකාලික කපිතන්) ජීඑම්ටී බණ්ඩාර ගමගෙදර ;
නි/4807 ලුතිතන් (තාවකාලික කපිතන්) බීඑම්එම්ජී ගුණතිලක ;
නි/4845 ලුතිතන් (තාවකාලික කපිතන්) ජීපීජීඑස් පතිරණ ;
නි/4812 ලුතිතන් (තාවකාලික කපිතන්) ඩීකේයූ සරත් කුමාර ;
නි/4824 ලුතිතන් (තාවකාලික කපිතන්) කේඑම්ජී සමරකෝන් ;
නි/5238 ලුතිතන් (තාවකාලික කපිතන්) ජීඑච් නන්දසිරි ;
නි/5375 ලුතිතන් (තාවකාලික කපිතන්) ඩීඑම්එස්බී දිසානායක ;
නි/5693 ලුතිතන් (තාවකාලික කපිතන්) ඩබ්එම්ජී සිරිපාල ;
නි/5696 ලුතිතන් (තාවකාලික කපිතන්) කේපී ගමගේ ;
නි/5697 ලුතිතන් (තාවකාලික කපිතන්) එම්ටීයූ බලසේකර ;
නි/5714 ලුතිතන් (තාවකාලික කපිතන්) එල්එච්ඩී තුෂාර ;
නි/5799 ලුතිතන් (තාවකාලික කපිතන්) ජීබීටීබී වැගන්තලේ ;
නි/5928 ලුතිතන් (තාවකාලික කපිතන්) ඩීඑම්එස්බී දිසානායක ;
නි/5931 ලුතිතන් (තාවකාලික කපිතන්) ටීඑම්ඩීඑන් සුමන බණ්ඩාර ;
නි/5935 ලුතිතන් (තාවකාලික කපිතන්) ඒඩබ්එන්එම්එස්කේ අබේකෝන් ;
නි/5939 ලුතිතන් (තාවකාලික කපිතන්) ඩබ්එල්කේඅයි ලියනගේ ;
නි/5946 ලුතිතන් (තාවකාලික කපිතන්) බීයූ තිලකරත්න ;
නි/5913 ලුතිතන් (තාවකාලික කපිතන්) ජීයූඑල්ඩී ජයකොඩි ;
නි/5705 ලුතිතන් (තාවකාලික කපිතන්) කේඒඩබ්එස් කොඩිතුවක්කු ;
නි/6039 ලුතිතන් (තාවකාලික කපිතන්) බීආර්සී ජයරත්න ;
නි/6044 ලුතිතන් (තාවකාලික කපිතන්) ආර්ඩීඒඑස් රාජපක්ෂ ;
නි/6045 ලුතිතන් (තාවකාලික කපිතන්) එච්ජීඑල් ප්‍රියන්ත ;
නි/6055 ලුතිතන් (තාවකාලික කපිතන්) ඩබ්පීපී විදාන පතිරණ ;
නි/6058 ලුතිතන් (තාවකාලික කපිතන්) ආර්සීකේ සේනාරත්න ;
නි/6059 ලුතිතන් (තාවකාලික කපිතන්) ඩීඑම්එස්කේ දිසානායක ;
නි/6062 ලුතිතන් (තාවකාලික කපිතන්) පීඑන් අමරසිංහ ;
නි/6051 ලුතිතන් (තාවකාලික කපිතන්) ඩබ්එම්ආර්බී වන්නිනායක.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

කොළඹ දී ය.

08-300

# රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(2) (අ) වගන්තිය යටතේ නියමය**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(2)(අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් "මිෂනාරිස් ඔෆ් චැරිටි ආයතනයේ ශාන්ති නිවස" එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2010 ජුනි මස 29 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

**උපලේඛන**

"මිෂනාරිස් ඔෆ් චැරිටි ආයතනයේ ශාන්ති නිවස"

08-359

මගේ අංකය : ඩීඑස්/ඊපී/එච්/කෝවිල්/34.

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, එරාවුර්පත්තුව, සෙංකලඩි**

වන්දනා ගමන් ආඥාපනත යටතේ සිත්තාණ්ඩි ශ්‍රී එත්කිරවේලායුද සුවාමි කෝවිල් උත්සවය - 2010

යථෝක්ත උත්සවය 2010 අගෝස්තු මස 09 වැනි දින පටන්ගෙන 2010 අගෝස්තු මස 24 වැනි දින දක්වා පවත්වනු ලබන බව මෙම උත්සවයට වන්දනා සඳහා පැමිණෙන අයගේ සහ අනෙකුත් සියළු දෙනාගේම දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1948.07.16 වැනි දින අංක 9886 දරන ආණ්ඩුවේ *ගැසට් නිවේදනයේ* සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සවය සමයේදී එහි උත්සවයට පැමිණෙන සියල්ලන්ගේ හා අනෙකුත් අයගේ අවධානය මෙයින් යොමු කරවමි.

ටී. ඩිනේෂ් මහත්මිය,
ප්‍රාදේශීය ලේකම්,
ඒරාවුර්පත්තු.

08-225

*අංකය : ප්‍ර. නො. 11/2/35/08/2010/පිටු/සැ.*

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තිරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව/තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචිකළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2010.08.09 වැනි දින සිට 2010.08.23 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00ට සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව, පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2010.08.30 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**උපලේඛනය**

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තරය* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "ජී" දරන කොට්ඨාසයේ 1377 වෙළුමේ 298 පත්‍රිරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ, තලංගම උතුරු ගමේ පිහිටි බටදොඹගහලන්ද වර්ජිනියා එස්ටේට් නමැති ඉඩමේ කේ. ඩී. ජී. වීරසිංහ මානක තැනගේ 2002.06.17 දින අංක 2229 දරන පිඹුර මතින් මැන බෙදා වෙන් කළ කැබලි අංක 03 දරන අ. 0. රූ. 0. පර්. 10.28 විශාලත්වයෙන් යුත් බිම් කොටසට එකී පිඹුරේ ප්‍රකාර මායිම්,<br>*උතුරට* : කැබලි අංක 2,<br>*නැගෙනහිරට* : කැබලි අංක 67<br>*දකුණට* : කැබලි අංක 04,<br>*බස්නාහිරට* : යූ. ජයසේනට අයිති ඉඩම | එම්. ඩබ්. සෙනවිරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2005.01.06 වැනි දින ලියා සහතික කළ අංක 12953 දරන විකුණුම්කර ඔප්පුව |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
අංක 243/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

08-171

---

*අංකය : ප්‍ර. නො. 11/2/35/10/2010/පිටු/සැ.*

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචිකළ පොත්/පිටුව නැවත සම්පූර්ණව/තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචිකළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2010.08.16 වැනි දින සිට 2010.08.30 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00ට සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව, පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2010.09.06 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**උපලේඛනය**

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තරය* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "ජී" දරන කොට්ඨාසයේ 250 වෙළුමේ 255 පත්‍රිරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝකන්දර උතුර ගමේ පිහිටි ඉඩම් කට්ටිය නොහොත් ලඳුබිම නොහොත් හොරගහලන්ද නමැති අ. 2, රූ. 0, පර්. 0 විශාලත්වයෙන් යුත් ඉඩමට එම්. ඩී. ඒ. ගුණතිලක මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද 1940.02.26 දින අංක 1783 දරන පිඹුරේ ප්‍රකාර මායිම්, *උතුරට* : ආර්. ඊ. එස්. ද සොයිසාට අයත් සෙන්ට් කැතරින් එස්ටේට්, *නැගෙනහිරට සහ දකුණට* : මෙම ඉඩමේ කොටසක්, *බස්නාහිරට* : වී. ජුවානිස් පෙරේරාට අයිති මෙම ඉඩමේ ලොට් ඒ | 1. බී. වී. රණසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1955.09.29 වැනි දින ලියා සහතික කරන ලද අංක 14265 දරන තෑගි ඔප්පුව<br>2. එස්. ඩබ්. ලියනගේ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1991.07.01 දින ලියා සහතික කළ අංක 1304 දරන තෑගි ඔප්පුව<br>3. එස්. ඩබ්. ලියනගේ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1991.07.01 දින ලියා සහතික කළ අංක 1305 දරන තෑගි ඔප්පුව<br>4. ඒ. ආර්. යූ. හකීම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1992.10.13 දින ලියා සහතික කළ අංක 69 දරන විකුණුම් ඔප්පුව. |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 243/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

08-305

---

**වන්දනා ගමන් ආඥාපනත**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ රොටුඹ පෙත්මග පුරාණ රජමහා විහාරයේ 2010 වාර්ෂික ආගමික උත්සවය 2010 අගෝස්තු මස 31 අඟහරුවාදා දින සිට 2010 සැප්තැම්බර් මස 06 සඳුදා දින දක්වා පවත්වනු ලබන බව 175 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ 02 වැනි වගන්තිය අනුව 2009.09.18 වැනි නිකුත්කරන ලද අංක 1620 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* යටතේ මෙයින් දන්වමි.

ඩී. ආර්. ජයතිලක,
ප්‍රාදේශීය ලේකම්,
පස්ගොඩ.

2010 ජූලි මස 20 වැනි දින,
පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-174

---

මගේ අංකය : පීආර්/1/4/70

**ගැසට් නිවේදනය**

ගරු විදේශ කටයුතු ඇමතිතුමන් විසින් 2010 ජුනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි කොළඹ නියුතු බැනින් ජනරජයේ නිර්වේතනික කොන්සල් වශයෙන් මහේන්ද්‍ර දයානන්ද මහතා සතුටින් පිළිගෙන ඇත.

සී. ආර්. ජයසිංහ,
ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය,

2010 ජූලි මස 26 වැනි,
කොළඹ 01, ජනරජ ගොඩනැගිල්ලේ,
විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

08-222

**ණය සහනදායක ආඥාපනත**

**දැන්වීමයි**

ණය සහනදායක ආඥාපනතේ 2(1) වැනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පහත සඳහන් තැනැත්තන් 2010 ජූලි මස 27 වැනි දින සිට තුන් අවුරුදු කාල පරිච්ඡේදයක් සඳහා ණය සහනදායක මණ්ඩලයේ සාමාජිකයින් ලෙස පත් කරනු ලැබ ඇත:

(1) මාලනී අබේවර්ධන රණතුංග මිය,
(2) ඩී. එම්. සරත්චන්ද්‍ර මයා,
(3) එම්. ඒ. එන්. සරත්චන්ද්‍ර ගුණවර්ධන මයා,
(4) පියසේන සෝමරත්න මයා,
(5) කේ. ඒ. පී. රාජකරුණා මයා

මාලනී අබේවර්ධන රණතුංග මිය මණ්ඩලයේ සභාපතිනිය වශයෙන් පත් කරනු ලැබ ඇත.

සුහද කේ. ගමලත්,
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

2010 ජූලි මස 23 වැනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

08-172

*මගේ අංකය : පීආර්/1/4/41*

**ගැසට් නිවේදනය**

ගරු විදේශ කටයුතු ඇමතිතුමන් විසින් 2010 ජූනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි කොළඹ නියුතු නවසීලන්තයේ නිර්වේතනික කොන්සල් වශයෙන් සෙම්බුකුට්ටි ආරච්චිගේ සේනක විමලනාත් සිල්වා මහතා සතුටින් පිළිගෙන ඇත.

සී. ආර්. ජයසිංහ,
ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය,

2010 ජූලි මස 26 වැනි දින,
කොළඹ 01, ජනරජ ගොඩනැගිල්ලේ,
විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

08-221

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බොරැල්ල ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සමන් ජයසිංහ.

2010.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2007.10.18 දින සහ අංක 3006 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සමන් ජයසිංහ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිහත්ලක්ෂ අනූතුන්දහස් අටසිය පනස්දෙකයි ශත පහළොව (රු. 27,93,852.15) ක මුදලක් 2010.05.13 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 27,93,852.15ක මුදලට 2010.05.14 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිවූර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3006 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

*උපලේඛනය*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඩවත් සතර මාතර ප්‍රාදේශීය සභා සීමාව තුළ, වේරදූවේ පිහිටි පුංචිකොරටුව, කුන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් බී නමැති බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : ගම් සහා පාරෙන් ද, නැගෙනහිරට : හොට්ටුඅත්තේවත්ත සහ කුන්ගහකොරටුවෙන් ද, දකුණට : සුළු පාරෙන් ද සහ බටහිරට : මෙම ඉඩමේ ලොට් ඒ වලින් ද මායිම් වූ පර්චස් විසිපහ (අ. 0, රූ. 0, පර්. 25)ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 465/182 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී ඉඩම් කොටස බලයලත් මානක සී. එස්. ජයවර්ධන විසින් මැන සාදන ලද 1997.02.20 හි අංක 5594 දරන පිඹුර ප්‍රකාරව මෑතක දී කරන ලද මැනීමකට අනුව පහත පරිදි විස්තර වේ :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඩවත් සතර මාතර ප්‍රාදේශීය සභා සීමාව තුළ වේරදූවේ පිහිටි පුංචිකොරටුව, කුන්ගහවත්ත පුංචිකොරටුව නමැති ඉඩමට බලයලත් මානක සී. එස්. ජයවර්ධන විසින් 1997.02.20 දිනැති අංක 5594 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 1 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : මාතර සිට වේරහේන දක්වා ඇති පාරෙන් ද, නැගෙනහිරට : හොට්ටුඅත්තේවත්ත සහ කුන්ගහකොරටුවෙන් ද, දකුණට : මාතර සිට යටියන දක්වා ඇති පාරෙන් ද සහ බටහිරට : එම ඉඩමේම ලොට් ඒ වලින් ද මායිම් වූ එකී අංක 5594 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිහතරයි දශම එකයි නමය (අ. 0, රූ. 0, පර්. 24.19) ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

08-353/2

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - වැලිමඩ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ෂෙරීෆ්ඩීන් මොහමදු හසීම් සහ සිති සුහාර බීබි මොහමඩ් හසීම්.

2010.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් එච්. අමරකෝන් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 1998.07.12 දිනැති සහ අංක 9062 සහ 2006.03.16 දින අංක 10952 දරන උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ෂෙරීෆ්ඩීන් මොහමදු හසීම් සහ සිති සුහාර බීබි මොහමඩ් හසීම් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හයලක්ෂ පනස්දහස් තුන්සිය අසූනවයයි ශත එක (රු. 6,50,389.01) ක මුදලක් 2009.11.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 6,50,389.01ක මුදලට 2009.12.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 9062 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ඒ. ජී. ඒ. කොට්ඨාසයෙහි, දඹවිනි පළාත කෝරළේ, ගුරුතලාව ග්‍රාමසේවා කොට්ඨාසයේ ගුරුතලාව ගමෙහි පිහිටි "පූනවැව පතාන" නමැති ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් මැන සාදන ලද එෆ්. වී. පී. 189හි ලොට් 172 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් 181 සහ 171න් ද, නැගෙනහිරට : ලොට් 171න් ද, දකුණට : ලොට් 48ඞී සහ 173න් ද සහ බස්නාහිරට : ලොට් 48ඞී සහ 181න් ද මායිම් වූ පිඹුරු ප්‍රකාරව අක්කර දහයයි පර්චස් බිංදුවයි හතර (අ. 10, රූ. 0, පර්. 04) ක් විශාල ඉඩම තුළ පිහිටි සියලුම දේත් සමග මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් එල්. ඩී. ඕ 10/118 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

08-353/11

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - නුගේගොඩ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

විතානගේ දීපාල් රෝහිත කුරේ සහ ඉලන්දාරිදේව කුසුමලතා ජයවීර රණසිංහ.

2010.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2005.12.08 දිනැති සහ අංක 2313 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විතානගේ දීපාල් රෝහිත කුරේ සහ ඉලන්දාරිදේව කුසුමලතා ජයවීර රණසිංහ යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හැටදෙදහස් දෙසිය හැත්තෑ අටයි ශත තිස්හය (රු. 2,62,278.36) ක මුදලක් 2010.04.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 2,62,278.36ක මුදලට 2010.05.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2313 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එස්. මනම්පේරි ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, අදිකාරි පත්තුවේ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ගම්මන්පිල හි පිහිටි "වල්ගම්කැලේ" නමැති ඉඩමට බලයලත් මානක සී. වික්‍රමගේ විසින් මැන සාදන ලද අංක 1170/2 සහ 1992 ජූලි මස 17 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 2 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම්, ඊසාන දිශාවට : පිඹුරු අංක 20074ට අයත් ලොට් 221න් ද, ගිණිකොණ දිශාවට : පිඹුරු අංක 1170ට අයත් ලොට් 3න් ද නිරිත දිශාවට : පාරෙන් ද (පිඹුරු අංක 20074ට අයත් ලොට් 218) සහ වයඹ දිශාවට : පිඹුරු අංක 170ට අයත් ලොට් 1න් ද මායිම් වූ අංක 1170/2 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිහතයි දශම නවයයි තුන (අ. 0, රූ. 0. පර්. 27.93)ක් විශාල ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. 8/211 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

08-353/10

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කොට්ටාව ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ලිහිනිකඩුවගේ ජගත් දේවින්ද ලිහිනිකඩුව.

2010.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2005.01.25 දිනැති සහ අංක 1159 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලිහිනිකඩුවගේ ජගත් දේවින්ද ලිහිනිකඩුව යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පනස්දහස් එකසිය අසූපහයි ශත තිස්අට (රු. 1,50,185.38) ක මුදලක් 2010.06.02 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 1,50,185.38ක මුදලට 2010.06.03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1159 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවට අයිති සිද්ධමුල්ල තුළ පිහිටි වැතර උපකාර්යාලයට අයත් කිතුල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩී. කපුගීකියන විසින් මැන සාදන ලද අංක 6012 සහ 2004 ඔක්තෝබර් මස 23 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් "ඒ " ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : පිඹුරු අංක 1516ට අයත් ලොට් 9හි අඩි 20 පළල ඇති පාරෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 1516හි ලොට් 6න් ද, දකුණට : පිඹුරු අංක 2160ට අයත් අයත් ලොට් 6න් ද සහ බස්නාහිරට : පිඹුරු අංක 1516ට අයත් ලොට් 8න් ද මායිම් වූ එකී අංක 6012 දරන පිඹුර ප්‍රකාර පර්චස් පහළොවයි දශම අටයි පහ (අ. 0, රූ. 0, පර්. 15.85) ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග පිහිටි ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

08-353/9

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කොට්ටාව ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ලිහිනිකඩුවගේ ජගත් දේවින්ද ලිහිනිකඩුව සහ වීරරත්න ආරච්චිගේ ආශා මනෝරි ලිහිනිකඩුව.

2010.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2005.08.18 දිනැති සහ අංක 1047 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලිහිනිකඩුවගේ ජගත් දේවින්ද ලිහිනිකඩුව සහ වීරරත්න ආරච්චිගේ ආශා මනෝරි ලිහිනිකඩුව යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ අනූනවදහස් එකසිය අසූහතයි ශත අට (රු. 5,99,187.08) ක මුදලක් 2010.06.02 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 5,99,187.08ක මුදලට 2010.06.03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1047 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එස්. රාමනායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, කිරිගම්පමුණුව ගමෙහි පිහිටි කහටහගහලන්ද නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද අංක 1829 සහ 2000 ජූනි මස 25 වැනි දන දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 7" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : මෙම පිඹුරේ ලොට් 6 සහ 1376 දරන පිඹුරේ ලොට් 3 ද, නැගෙහිරට : 1376 දරන පිඹුරේ ලොට් 3 සහ 1502 පිඹුරේ ලොට් 127න් ද, දකුණට : 1502 පිඹුරේ ලොට් 127 සහ මෙම පිඹුරේ ලොට් 21න් ද සහ බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 21 සහ ලොට් 6 න් ද මායිම් වූ එකී අංක 1829 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහයයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 10.40) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි හයයි තුන (හෙක්. 0.0263)ක් විශාල ඉඩම තුළ ඇති ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලුම දේත් සමග මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 352/10 හි ලියාපදංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

08-353/8

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කහවත්ත ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

පිටදූව ගමගේ පුණ්‍යකුමාර විජයසිංහ.

2010.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එච්. කොස්ගොඩගේ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2004.09.23 දිනැති සහ අංක 354 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඉහත පිටදූව ගමගේ පුණ්‍යකුමාරි විජයසිංහ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අටලක්ෂ පනස් නවදහස් හාරසිය තිස්අටයි ශත පනස්අට (රු. 8,59,438.58) ක මුදලක් 2010.03.16 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 8,59,438.58ක මුදලට 2010.03.17 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 354 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලං කෝරළේ, පන්නිල පත්තුවේ, අටකලංපන්න ප්‍රාදේශීය සභාවාට අයත් කහවත්ත උප කාර්යාල සීමාව තුළ නුගවෙල ගමෙහි පිහිටි නුගවෙල "වතුයාය හෙවත් බණ්ඩාරහේන" නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. දන්තනාරායන විසින් මැන සාදන ලද අංක 120 සහ 1972.04.06 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 30 ලෙස ලකුණු කොට ඇති ඉඩම් කොටසට වන උතුරට : ලොට් 26න් ද, නැගෙනහිරට : ලොට් 31 න් ද, දකුණට : ලොට් 34න් ද සහ බස්නාහිරට : බණ්ඩාරහේන දොලෙන් සහ පුවක්ගහදෙනියගොඩහේනෙන් ද මායිම් වූ එකී අංක 120 දරන පිඹුර ප්‍රකාරව වූ රූඩ් දෙක (අ. 0, රූ. 2, පර්. 0) ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග පිහිටි ඉඩම රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 217/92 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

08-353/5

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කහවත්ත ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ඇල්පිටිය හීන් වියන්නලාගේ යසරත්න.

2010.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එච්. කොස්ගොඩ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2006.03.20 දිනැති සහ අංක 689 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඉහත ඇල්පිටිය හීන් වියන්නලාගේ යසරත්න යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හත්ලක්ෂ හැටනවදහස් තුන්සියයි ශත තුන (රු. 7,69,300.03) ක මුදලක් 2010.04.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 7,69,300.03ක මුදලට 2010.05.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 689 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලං කෝරළේ, තඹගම පත්තුවේ, අටකලංපන්න ප්‍රාදේශීය සභාවට අයත් ගොඩකවෙල උප කාර්යාල සීමාව තුළ බලවින්න ගමෙහි පිහිටි "නුගහේනවත්ත හෙවත් දම්පහලන්දවත්ත" නමැති ඉඩමට බලයලත් මානක එම්. එම්. ඩී. එස් ශාන්ත විසින් මැන සාදන ලද අංක 1700 සහ 2001.03.02 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලොට් 3 ලෙස ලකුණු කොට ඇති ඉඩමේ කොටස වන උතුරට : අතුරහේනෙන්ද, නැගෙනහිරට : අමරතුංග හිමිකම් කියන දම්පහලන්දවත්ත කොටසින් ද, දකුණට : මාදම්පේ සිට හම්බන්තොට දක්වා දිවෙන ප්‍රධාන පාරෙන් ද සහ බස්නාහිරට : පිඹුරු අංක 1700ට අයත් ලොට් 2න් ද මායිම් වූ එකී අංක 1700 දරන පිඹුර ප්‍රකාරව වූ රූඩ් එකයි, පර්චස් පහයි දශම නවය (අ. 0, රූ. 1, පර්. 5.9) ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග පිහිටි ඉඩම රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 385/176 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

08-353/7

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කහවත්ත ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

පිටදූව ගමගේ පුණ්‍යකුමාර විජයසිංහ.

2010.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. අබේරත්න විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2007.03.21 දිනැති සහ අංක 4436 දරන උකස් බැඳුම්කරය අයවිය යුතු මුදල් ගෙවීම ඉහත පිටදූව ගමගේ පුණ්‍යකුමාර විජයසිංහ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිඑක්ලක්ෂ හතලිස්එක්දහස් පන්සිය අනූතුනයි ශත හැටහත (රු. 21,41,593.67) ක මුදලක් 2010.03.16 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 21,41,593.67ක මුදලට 2010.03.17 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 4436 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලං කෝරළේ, පන්නිල පත්තුවේ, කහවත්ත ප්‍රාදේශීය සභා සීමාව තුළ නුගවෙල ගමෙහි පිහිටි "අම්බලමගාවදෙනිය" නමැති ඉඩමට බලයලත් මානක කේ. ඒ. කේ. එල්. එදිරිසිංහ විසින් මැන සාදන ලද අංක 1361 සහ 2006 සැප්තැම්බර් මස 25 වැනි දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස ලකුණු කොට ඇති ඉඩම් කොටස වන උතුරට : වරිපනම් අංක 187 දරන ඉඩමෙන් ද, නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටසින් ද, දකුණට : වරිපනම් අංක 189ඒ දරන ඉඩමෙන් ද, සහ බස්නාහිරට : ප්‍රධාන පාරෙන් ද මායිම් වූ එකී අංක 1361 දරන පිඹුර ප්‍රකාරව වූ පර්චස් දාහතයි දශම නවය (අ. 0, රූ. 0, පර්. 17.9) ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග පිහිටි ඉඩම රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 286/229 ශිර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

08-353/6

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බුත්තල ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

දිසානායක මුදියන්සේලාගේ දයාරත්න.

2010.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. ලියනගේ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2003.10.01 දිනැති සහ අංක 915 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දිසානායක මුදියන්සේලාගේ දයාරත්න යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ අසූඅටදහස් හත්සිය දාහතරයි ශත දොළහ (රු. 4,88,714.12) ක මුදලක් 2010.01.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 4,88,714.12ක මුදලට 2010.02.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 915 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල කෝරළේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගැරින්ඩිබකින ගමේ පිහිටි ගැරඩි බකිණලන්ද නමැති ඉඩමට බලයලත් මානක එල්. කේ. ගුණසේකර විසින් මැන සාදන ලද අංක 2003.04.23 දිනැති අංක 3835 දරන පිඹුරේ ලොට් 2 නමැති ඉඩමට මායිම් වන උතුරට : ලොට් 1න් ද, නැගෙනහිරට : හීනිමැණිකා හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : එස්. එම්. පියසේන හිමිකම් කියන ඉඩමෙන් ද සහ බස්නාහිරට : පාර සඳහා වෙන් කරන ලද කොටසින් ද මායිම්ව, රූඩ් එකයි පර්චස් විස්ස (අ. 0. රූ. 1, පර්. 20) ක් විශාල ඉඩම සමග එහි පිහිටි සියලු දේත් සමග වන මෙය මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 445/261 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

08-353/4

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

සීමාසහිත සිල්වන් ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගමේ ණය වගකීම සඳහා උකස් කරන ලද දේපළ.

2009.11.12 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ඩබ්. ඩී. එල්. ගුණතිලක විසින් සහතික කරන ලද 1998.07.30 වැනි දිනැති අංක 2885 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.09.30 වැනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් පනස්හතර ලක්ෂ අසූඅට දහස් හත්සිය අනූනවයයි ශත විසිහයක (රු. 54,88,799.26) මුදලක් සමග රුපියල් විසිතුන්ලක්ෂ එකසිය අසූවයි ශත හතලිස් දෙකක (රු. 23,00,180.42) මුදලක් මත වසරකට සියයට විසිහතර (24%) බැගින් පොළියක් ද, 2009.10.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක්, ගම්පහ, කෙළින් වීදිය, අංක 23හි සීමාසහිත සිල්වන් ඩිවලොප්මනට් (පුද්ගලික) සමාගමෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 2885 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් පනස්හතර ලක්ෂ අසූඅට දහස් හත්සිය අනූනවයයි ශත විසිහයක (රු. 54,88,799.26) මුදල සමග 2009.10.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරටය අයවියයුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් වෙන්දේසිකාර මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ ද මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකුවේ, අයකර ගැනීමේ ඒකකයේ සම්බන්ධතා කළමනාකරු (අයකර ගැනීම් - ආයතනික) හට ද, මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගම්පහ නගර සභා සීමාව තුළ ගම්පහ මැදගම පිහිටි කෙළින් වීදියේ, වරිපනම් අංක 25 දරන මරදගහදෙණිය නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු කේ. ජී. හියුබට් පෙරේරා විසින් සාදන ලද 1955 ඔක්තෝබර් මස 02 දිනැති අංක 5796 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කර නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : කෙළින් වීදියේ වරිපනම් අංක 29 දරන, එච්. ආර්. ෂෙල්ටන් හා වෙනත් අයට අයිති ඉඩම සහ ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 1 සහ කෙළින් වීදිය ද, දකුණට : ලොට් 3 ද, බස්නාහිරට : ප්‍රසිද්ධ බස්නැවතුම්පල ද මායිම්ව පර්චස් අටයි දශම පහයි බිංදුවක (අ. 0, රූ. 0. පර්. 8.50) බිම් ප්‍රමාණයකින් සමන්විතය.

එකී බිම් කැබැල්ල පහත සඳහන් බිම් කැබැල්ලෙන් බෙදූ හා සීමා නිර්ණය කරන ලද්දකි, එනම්,

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයෙ. අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගම්පහ නගර සභා සීමාව තුළ මැදගම, කෙළින් වීදියේ වරිපනම් අංක 23, 25 සහ 27 දරන මරදගහදෙණිය නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු කේ. ජී. එච්. පෙරේරා විසින් සාදන ලද 1985 ජූලි මස 06 දිනැති අංක 3272 දරන පිඹුරෙහි සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම උතුරට : එච්. ආර් ෂෙල්ටන් සහ වෙනත් අයට උරුමකම් කියන කෙළින් වීදියේ, අංක 29 දරන දේපළ ද, නැගෙනහිරට : කෙළින් විදිය ද, දකුණට : සී. බාලසූරිය උරුමකම් කියන කෙළින් වීදියේ, වරිපනම් අංක 17 දරන දේපළ ද, බස්නාහිරට : ප්‍රසිද්ධ බස්නැවතුම් පළ ද මායිම්ව පර්චස් විසිදෙකයි දශම දෙකයි පහක (අ. 0. රූ. 0, පර්. 22.5) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G19/46හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඩී. සිල්වා,
සම්බන්ධතා කළමනාකරු,
(අයකර ගැනීම් - ආයතනික).

ලංකා බැංකුව,
අයකර ගැනීමේ ඒකකය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01

2010.02.17 දිනැති උසාවි නියෝගය පරිදි සීමාසහිත සිල්වන් ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම විසින් රුපියල් දෙලක්ෂයක (රු. 2,00,000) මුදලක් තැන්පත් කර ඇති අතර එය "අවිනිශ්චිත ගිණුම-ණය හිමියෝ " හි දක්වා ඇත.

08-329

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බොරැල්ල ශාඛාව
### (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

පැපිලියානගේ ශිරානි මංජුලා පෙරේරා තෙන්නකෝන්.

2010.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2006.09.14 සහ 2009.12.11 දිනැති සහ පිළිවෙලින් අංක 2765 සහ 3570 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පැපිලියානගේ ශිරානි මංජුලා පෙරේරා තෙන්නකෝන් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හතලිස්හයලක්ෂ පන්දහස් හත්සිය තිස්තුනයි ශත අසූදෙක (රු. 46,05,733.82) ක මුදලක් 2010.03.08 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 46,05,733.82ක මුදලට 2010.03.09 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවනල ද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2765 සහ 3570 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එස්. මනම්පේරි ලවා ප්‍රසිද්ධ

වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ, මහනුවර මහ නගර සභා සීමාවේ, වටපුළුව පිහිටි බෝමළුව පාරේ, වරිපනම් අංක 74/1බී දරන "මල්ගහමුදුනේවත්ත නොහොත් වත්තේගෙදර තැන්න හේන" නමැති ඉඩමට බලයලත් මානක ජී. ආර්. ඩබ්. එම්. වීරකෝන් විසින් පිළියෙල කරන ලද 1997.03.31 දිනැති අංක 8684 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් 2 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 4 (පාර)න් ද, නැගෙනහිරට : ලොට් 3න් ද, දකුණට : ඒ. ආර්. එම්. සියාතු සහ තවත් අය හිමිකම් කියන ඉඩමෙන් ද (වරිපනම් අංක 5/80) සහ බටහිරට : ලොට් 1න් ද මායිම් වූ එකී අංක 8684 දරන පිඹුර ප්‍රකාර පර්චස් එකොළහයි දශම පහයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 11.50) ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමග වේ. මෙම ඉඩම මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 314/55 යටතේ ලියාපදිංචි වී ඇත.

බලයලත් මානක ජී. ආර්. ඩබ්. එම්. වීරකෝන් විසින් පිළියෙල කරන ලද 1997.03.31 දින අංක 8684 දරන එකී පිඹුරේ පෙන්නුම් කර ඇති ලොට් 4 දරන පාරක් සඳහා වෙන් කර ඇති මාර්ගය සහ බෝමළුව පාරට විහිදෙන පාර මතින් මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

08-353/3

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - අලුත්ගම ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

බමුණුගේ සමන් විජිත කුමාර ද සිල්වා.

2010.06.03 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2008.05.23 දිනැති සහ අංක 2398 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම බමුණුගේ සමන් විජිත කුමාර ද සිල්වා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එකසිය විසිලක්ෂ දෙදහස් පන්සිය හැත්තෑදෙකයි ශත හැත්තෑහතර (රු. 12,02,572.74) ක මුදලක් 2009.06.14 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 12,02,572.74ක මුදලට 2009.06.15 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවනල ද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2398 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩලස් කෙලාර්ට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටුමුණ දකුණ, අලුත්ගම බැද්ද ප්‍රාදේශීය සභා සීමාවේ, බේරුවල උප කාර්යාල සීමාවේ, කළුවාමෝදර ගමේ පිහිටි වැල්බොඩහීන්දිගන නමැති ඉඩමට බලයලත් මානක ජී. එල්. ඩබ්. පෙරේරා විසින් පිළියෙල කරන ලද 2000.05.25 දිනැති අංක 1830 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් 2 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1න් ද, නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : පාරෙන් ද සහ බටහිරට : මුල්ලෙපිටිය පුද්ගලයන්ට අයත් ඉඩමෙන් ද මායිම් වූ එකී අංක 1830 දරන පිඹුර පර්චස් විස්සයි දශම හයයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 20.60)ක් විශාල ඉඩම. ගොඩනැගිලි ගහ, කොළ සහ සියලු දේත් සමග වේ. මෙම ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 232/274 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

08-353/1

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010 ජුනි මස 17 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් එල්. එස්. ආතාවුද විසින් සහතික කරන ලද 1996.03.01 වැනි දිනැති අංක 216/222 දරන උකස් බැඳුම්කරය මත කාලීන ණය මත පිටහිටි මුල් මුදල හා 2010.05.31 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් හැත්තෑහත් ලක්ෂ පනස්පන්දහස් නවසිය පනස් දෙකයි ශත අනූවක (රු. 77,55,952.90) මුදලක් සමග රුපියල් විසිලක්ෂ හැත්තෑපන් දහසක (රු. 20,75,000) මුදලක් මත වසරකට සියයට දාහතර (14%) බැගින් පොළියක් ද, 2010.06.01 වැනි දින සිට ගෙවීම් නිම කරන දිනය තෙක් දිගන, දිගන හංදිය, අංක 1/90 හි පිහිටි ඒ. බී. වනිගසේකර සහ සමාගම වෙතින් අයවිය යුතුව ඇත.

2. එකී අංක 216/222 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් හැත්තෑහත් ලක්ෂ පනස්පන්දහස් නවසිය පනස් දෙකයි ශත අනූවක (රු. 77,55,952.90) මුදල සමග 2010.06.01 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවියයුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර

ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, නව නීතිඥයින්ගේ කාර්යාල සංකීර්ණය, අංක 34/24හි පදිංචි වෙන්දේසිකාර ඉන්දු හේවාවිතාරණ මහත්මියට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකු ශාඛාවේ, සම්බන්ධතා කළමනාකරුට (අයකර ගැනීම් - ආයතනික) මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර උඩගම්පහ කෝරළේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාවේ, කෙන්ගල්ල පිහිටි "රජවැල්ලවත්ත" නමැති ඉඩමේ සර්වේයර් ජනරාල් විසින් සහතික කරන ලද අංක P. P. Maha 3464 දරන පිඹුරේ ලොට් 1 ලෙස දක්වා බෙදා වෙන් කළ කල්බදු අයිතිය සහිත එකී ලොට් 1 දරන බිම් කැබැල්ල උතුරට : පාර ද, නැගෙනහිරට : පාර සහ P. P. Maha 287හි ලොට් අංක 16 ද, දකුණට : P. P. Maha 287හි ලොට් අංක 16 ද සහ පාර ද, බස්නාහිරට : පාර ද මායිම් වන එකී අංක P. P. Maha 3464 ප්‍රකාර හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි බිංදුවයි හතරක (0.204) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර එහි ඇති සියලු දේ ද වේ. මෙම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E607/177හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. තිලකරත්න බණ්ඩා,
සම්බන්ධතා කළමනාකරු.

2010 ජූලි මස 12 වැනි දින,
ලංකා බැංකුව,
අයකර ගැනීමේ ඒකකය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01

08-328

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.12.10 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. බෙලිඅත්ත මහජන නොතාරිස් එච්. එන්. පී. නිශාන්ත මහතා විසින් සහතික කරන ලද 2008.09.26 දිනැති අංක 2479 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.10.14 දින තෙක් පොළිය වශයෙන් රුපියල් හයලක්ෂ හැත්තෑ එක් දහස් එකසිය හැටඅටයි ශත තිස්දෙකක (රු. 6,71,168.32) මුදලක් සමග රුපියල් පන්ලක්ෂ අසූතුන් දහස් තුන්සිය තිස් දෙකක (රු. 5,83,332) මත වසරකට සියයට විසිහතයි දශම පහයි බිංදුව (27.50%) බැගින් පොළියක් ද, 2009.10.15 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් හුංගම, බට අත, ඔපිසර ගෙදර හි පදිංචි කලසිංහ ඒකනායක රෙජී මහතා සහ කලසිං ඒකනායක ආරියසේන මහතා යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 2479 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් හයලක්ෂ හැත්තෑ එක් දහස් එකසිය හැටඅටයි ශත තිස්දෙකක (රු. 6,71,168.32) මුදල සමග 2009.10.15 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරටය අයවියයුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මාතර, කොටුව, විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39හි පදිංචි වෙන්දේසිකාර එම්. එච්. පද්මානන්ද සිරිවර්ධන මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකුව, තංගල්ල ශාඛාවේ, ශාඛා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ගිරුවාපත්තු-නැගෙනහිර, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාවේ, බට අත ග්‍රාමයේ පිහිටි අලුත්වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් සාදන ලද 2007 අගෝස්තු මස 20 දිනැති අංක 5530A දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස දක්වා නිරූපණය කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල උතුරට : පාර සහ එම ඉඩමේ ලොට් අංක 1 ද, නැගෙනහිරට : තාරපේරිය ගෙදර සහ එම ඉඩමේ ලොට් අංක 1 ද, දකුණට : මඩවල ගෙදර ද, බස්නාහිරට : පාර සහ පාලුවත්ත ද මායිම්ව එකී අංක 5530A දරන පිඹුර ප්‍රකාර රූඩ් තුනක (අ. 0, රූ. 3, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර ඒ සමග එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ඇතුලු සියලු දේ ද වේ.

එකී ලොට් අංක 2 පහත සඳහන් ඉඩමෙන් බෙදූ කොටසකි.

බටඅත පිහිටි අලුත්වත්ත නමැති ඉඩම් කැබැල්ල උතුරට : ගම්සභා පාර (වැව පාර) ද, නැගෙනහිරට : තාරපේරි ගෙදර ඉඩම ද, දකුණට : මඩවල ගෙදර ද, බස්නාහිරට : පාලුවත්ත ද, මායිම්ව අක්කර එකක (අ. 1, රූ. 0, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේද වේ. මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D94/149හි ලියාපදිංචි කර ඇත.

ජේ. කේ. ඒ. චන්ද්‍රසේන,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
තංගල්ල.

08-327

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.03.18 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ඩබ්. ඒ. එස්. සී. මැතිව් විසින් සහතික කරන ලද 2007.10.05 දිනැති අංක 4946 දරන බැඳුම්කරය මත මුල් මුදල හා

2009.10.27 දින තෙක් පොළිය වශයෙන් රුපියල් තිස්දෙලක්ෂ අනූඅට දහස් දෙසිය විසිඑකයි ශත පහක (රු. 32,98,221.05) මුදලක් සමග රුපියල් හයලක්ෂ අනූනවදහස් එකසිය හැටඅටයි ශත ශත පනස් එකක (රු. 6,99,168.51) සහ රුපියල් දාහත් ලක්ෂ පනස් හය දහස් පන්සිය හතලිස් තුනයි ශත හැටතුනක (රු. 17,56,543.63) ණය මුදලක් මත වසරකට සියයට විසිපහයි දශම හතයි පහ (25.75%) බැගින් පොළියක් ද, 2009.10.28 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කටාන, දිසාගෙවත්ත, ඇතුමන්කඩ පාර, අංක 13/1A හි සහ දෙමංහන්දිය, ග්‍රේස්ලන්ඩ් එස්ටේට් අංක 149/36 නව ලිපිනයෙහි පදිංචි කරනිලගේ ඉන්ද්‍රජිත් මෛත්‍රී සේනාධීර මහතා සහ රුවන්ති ප්‍රැන්සිකා රොද්‍රිගු මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 4946 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් තිස් දෙලක්ෂ අනූඅට දහස් දෙසිය විසි එකයි ශත පහක (රු. 32,98,221.05) මුදල සමග 2009.10.28 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවියයුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකුව ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව. මීගමුව කඩවීදිය ශාඛාවේ, ශාඛා කළමනාකරුටද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දූනගහපත්තුවේ, දෙමංහන්දිය සහ කොන්ඩෙගම්මුල්ල පිහිටි "ග්‍රේස්ලන්ඩ් එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් සාදන ලද 1992 නොවැම්බර් මස 07 දිනැති අංක 2789 දරන පිඹුරෙහි ලොට් 36 ලෙස දක්වා සීමා නිර්ණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 36 උතුරට : ලොට් 78 (අඩි 30 පළල පාරට වෙන් කළ කොටස) සහ ලොට් 37 ද, නැගෙනහිරට : ලොට් 37 සහ ජයරත්න ප්‍රනාන්දුගේ ඉඩම ද, දකුණට : ලොට් 35 සහ ජයරත්න ප්‍රනාන්දුගේ ඉඩම ද, බස්නාහිරට : ලොට් 35සහ ලොට් 78 (අඩි 30 පළල පාරට වෙන් කළ කොටස) ද මායිම් අංක 2789 දරන පිඹුර ප්‍රකාර පර්චස් දාහතරයි දශම හතයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 14.70) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි හතයි දෙකක (හෙක්ටයාර් 0.372) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ සහ වෙනත් සියළු දේද වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E962/168හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ආකාරයට දෙමංහන්දිය සහ කොන්ඩෙගම්මුල්ලේ හි පිහිටි ග්‍රේස්ලන්ඩ් එස්ටේට් නමැති ඉඩමෙහි අංක 2789 දරන පිඹුරේ ලොට් 37 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 37, උතුරට : ලොට් 78 (අඩි 30 පළල පාරට වෙන් කළ කොටස) සහ ලොට් 38 ද, නැගෙනහිරට : ලොට් 38 සහ ජයරත්න ප්‍රනාන්දුගේ ඉඩම ද, දකුණට : ලොට් 36 සහ ජයරත්න ප්‍රනාන්දුගේ ඉඩම ද, බස්නාහිරට : ලොට් 36 සහ ලොට් 78 (අඩි 30 පළල පාරට වෙන්කළ කොටස) ද, මායිම්ව එකී අංක 2789 දරන පිඹුර ප්‍රකාර පර්චස් දාහතරයි දශම හයයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 14.60) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි හයයි නවයක (හෙක්ටයාර් 0.0369) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර එහි ඇති ගහකොළ සහ වෙනත් සියළු දේද වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E962/169 හි ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

ඉහත කී ආකාරයට දෙමංහන්දිය සහ කොන්ඩෙගම්මුල්ල හි පිහිටි ග්‍රේස්ලන්ඩ් එස්ටේට් නමැති ඉඩමෙහි අංක 2789 දරන පිඹුරෙහි ලොට් 78 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 78 උතුරට : ලොට් 51 සිට 55, 65, 42 සිට 44 දක්වා ද 13 සිට 17 දක්වා ද, 21 සිට 24 දක්වා ද, 79 (පාර) 80, 81 සහ 82 (පාර) දක්වා ද, නැගෙනහිරට : ලොට් 47, 48, 29 සිට 43 දක්වා ද, 29 සිට 42 දක්වා සහ 82 (පාර) ද, දකුණට : ලොට් 48 සිට 50 දක්වා ද, 29 සිට 39 දක්වා ද, බස්නාහිරට : ලොට් 5 සිට 12 දක්වා ද, 20 සිට 24 දක්වා, 80, 81 (පාර) සහ 27 ද මායිම්ව එකී අංක 2789 දරන පිඹුර ප්‍රකාර රූඩ් තුනයි පර්චස් එකොලහයි දශම පහයි බිංදුවක (අ. 0, රූ. 3, පර්. 11.50) නැතහොත් හෙක්ටයාර් බිංදුවයි දශම තුනයි තුනයි දෙකයි හයක (හෙක්ටයාර් 0.3326) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E705/219 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ආකාරයට දෙමංහන්දිය සහ කොන්ඩෙගම්මුල්ල හි පිහිටි "ග්‍රේස්ලන්ඩ් එස්ටේට්" නමැති ඉඩමෙහි අංක 2789 දරන පිඹුරෙහි ලොට් 79 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 55, 56, 59 සහ 84 ද, නැගෙනහිරට : ඇල, ලොට් 55, 56, 59 සහ 77 ද, දකුණට : ලොට් 1 සිට 5 දක්වා සහ ලොට් 78 ද, බස්නාහිරට : ලොට් 1 සිට 5 දක්වා සහ ලොට් 78 ද මායිම්ව එකී අංක 2789 දරන පිඹුර ප්‍රකාර පර්චස් තිස්හතරක (අ. 0, රූ. 0, පර්. 34) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි අටයි හයයි බිංදුවක (හෙක්ටයාර් 0.0860) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E705/218 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ආකාරයට දෙමංහන්දිය සහ කොන්ඩෙගම්මුල්ල හි පිහිටි "ග්‍රේස්ලන්ඩ් එස්ටේට්" නමැති ඉඩමෙහි අංක 2789 දරන පිඹුරෙහි ලොට් 80 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 80 උතුරට : ලොට් 12, 14, 15, 17 සහ 18 ද, නැගෙනහිරට : ලොට් 79 (පාර) ලොට් 13, 16 සහ 77 ද, දකුණට : ලොට් 79 (පාර) සහ ලොට් 13, 19 සහ 20 ද, බස්නාහිරට : ලොට් 14, 15 සහ 18 ද මායිම්ව එකී අංක 2789 දරන පිඹුර ප්‍රකාර පර්චස් දොළහයි දශම පහයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 12.50) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E705/238 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ආකාරයට දෙමංහන්දිය සහ කොන්ඩෙගම්මුල්ල හි පිහිටි "ග්‍රේස්ලන්ඩ් එස්ටේට්" නමැති ඉඩමෙහි අංක 2789 දරන පිඹුරෙහි ලොට් 81 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : ලොට් ලොට් 24 සහ 25 ද, නැගෙනහිරට : ලොට් 79 (පාර) සහ 24 ද, දකුණට : ලොට් ලොට් 26 සහ 27 ද, බස්නාහිරට : ලොට් 25 සහ 26 ද මායිම්ව එකී අංක 2789 දරන පිඹුර ප්‍රකාර පර්චස් දෙකයි දශම අටයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 2.80) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි හතයි එකක (හෙක්ටයාර 0.0071) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E705/239 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ආකාරයට දෙමංහන්දිය සහ කොන්ඩෙගම්මුල්ල හි පිහිටි "ග්‍රේස්ලන්ඩ් එස්ටේට්" නමැති ඉඩමෙහි අංක 2789 දරන පිඹුරෙහි ලොට් 82 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 82 උතුරට : ලොට් 46 සහ 47 ද, නැගෙනහිරට : ලොට් 46 ද, දකුණට : ලොට් 44 සහ 45 ද, බස්නාහිරට : ලොට් 79 (පාර) ද මායිම්ව එකී අංක 2789 දරන පිඹුර ප්‍රකාර පර්චස් තුනයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 3.20) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි අටයි එකක (හෙක්ටයාර් 0.0081) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E705/240 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ආකාරයට දෙමංහන්දිය සහ කොන්ඩෙගම්මුල්ල හි පිහිටි ග්‍රේස්ලන්ඩ් එස්ටේට් නමැති ඉඩමෙහි අංක 2789 දරන පිඹුරෙහි ලොට් 83 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 83 සහ උතුරට : ලොට් 84 සහ ඇල ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් 78 (පාර) ද, බස්නාහිරට : ලොට් 62 සිට 65 දක්වා ද, මායිම්ව එකී අංක 2789 දරන පිඹුර ප්‍රකාර පර්චස් නවයයි දශම හතරයි බිංදුවක (අ. 0. රූ. 0, පර්. 9.40) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි තුනයි අටක (හෙක්ටයාර් 0.0238) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E705/241 හි ලියාපදිංචි කර ඇත.

ජී. එච්. එස්. ප්‍රනාන්දු,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
මීගමුව කඩවීදිය ශාඛාව.

08-326

---

## මහජන බැංකුව - උයන්වත්ත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.04.24 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් සහතික කරන ලද 2004.08.23 දිනැති අංක 393 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කපුගමගේ හඩ්සන් යන අය විසින් පැහැර හැර ඇති එකී උකස්කර අංක 393 යටතේ රුපියල් එක්ලක්ෂ පනස් තුන් දහස් දෙසිය දහ නවයයි ශත හතලිස් පහ (රු. 1,53,219.45) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2006.02.27 වැනි දින සිට වර්ෂයකට සියයට දහසය (16%) බැගින් රුපියල් එක්ලක්ෂ පනස්තුන් දහස් දෙසිය දහනවයයි ශත හතලිස් පහ (රු. 1,53,219.45) ක මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29ඒල් වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව රුපියල් එක්ලක්ෂ පනස් තුන් දහස් දෙසිය දහ නවයයි ශත හතලිස් පහ (රු. 1,53,219.45) ක මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 393 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගඟබඩ පත්තුවේ, කෝන්ගල පිහිටි තල්ගහ කොරටුව නමැති ඉඩමට බලයලත් මානක ඊ. එම්. ප්‍රේමසිරි මහතා විසින් ලියා සහතික කරන ලද අංක 1170 සහ 1997.04.23 දින දරන පිඹුර ප්‍රකාර අංක 01 දරන කැබැල්ලට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : හීන් දෙනිය ද, නැගෙනහිරට : කැබලි අංක 02 දරන කැබැල්ල ද, දකුණට : කැබලි අංක 04 සහ මහා මාර්ගය දක්වා දිවෙන පාර ද, බස්නාහිරට : කැබලි අංක 04 (පාර) ද වේ. යන මායිම් තුළ පිහිටි පර්චස් විසි නමයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 29.5) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සෑම සියලු දෙය ද වේ.

මෙම ඉඩම පහත සඳහන් ඉඩම සම්බන්ධයෙන් නැවත මැන සැකසූ සැලැස්මක් බැවින් නිසි හරස් සටහන් මගින් සම්බන්ධ කරන්නේ නම් මැනවි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගඟබඩ පත්තුවේ, කෝන්ගල පිහිටි තල්ගහ කොරටුව නමැති ඉඩමට මාතර දිසා අධිකරණයේ පැවති පී/5579 දරන නඩුවට අංක 1159 හා 1973.01.08 දින දරන පිඹුර අංක 01 දරන කැබැල්ලට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : හීන් දෙනිය ද, නැගෙනහිරට : කැබලි අංක 02 දරන කැබැල්ල ද, දකුණට : කැබලි අංක 04 සහ මහා මාර්ගය දක්වා දිවෙන පාර ද, බස්නාහිරට : කැබලි අංක 04 (පාර) ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසි නවයයි දශම හයයි හයක් (අ. 0, රූ. 0, පර්. 29.66) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සෑම සියළු දෙය ද වේ.

මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 275/288 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකරු,
මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය කාර්යාලය,
අංක 215, අනගාරික ධර්මපාල මාවත,
මාතර

08-308

---

## මහජන බැංකුව - මහියංගන ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.03.30 වැනි දින පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. එස්. දයාරත්න යන අය විසින් ලියා සහතික කරන ලද අංක 4890 හා 1990.05.20 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම විජේතුංග මුදියන්සේලාගේ රණසිංහ බණ්ඩා යන අය විසින් පැහැර හැර ඇති බැවින් එකී බැඳුම්කර අංක 4890 මත රුපියල් දෙලක්ෂ තිස්හයදහස් දෙසිය හතලිස් හතයි ශත එකක (රු. 2,36,247.01) මුදලක්

දැනට එකී මහජන බැංකුවට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. එබැවින් එකී රුපියල් දෙලක්ෂ තිස්හයදහස් දෙසිය හතලිස් හතයි ශත එකක (රු. 2,36,247.01) මුදල ද ඒ සමග එකී රුපියල් දෙලක්ෂ තිස්හයදහස් දෙසිය හතලිස් හතයි ශත එකක (රු. 2,36,247.01) මුදල මත 2003.09.19 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට දහසය (16%) බැගින් තවදුරටත් පොළිය ද, ඒ සමග එකී මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරගත යුතු මුදල් හා ගාස්තු ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු එකී මුදල් ප්‍රමාණය අයකර ගැනීම සඳහා බදුල්ල බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. ජයතිලක යන අය විසින් එකී අංක 4890 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### දේපළ පළිබඳ විස්තරය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බිම්තැන්න කෝරළේ, අරඹපිටියේ රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා සීමාව තුළ රිදීමාලියද්දේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. එම්. සමරනායක යන අය විසින් 1998.10.30 දින සකස් කරන ලද පිඹුරු අංක 1509හි කැබලි අංක 01 යනුවෙන් නිරූපණය කර බෙදා වෙන් කොට නිර්ණය කර ඇති "මැදකඩේවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන එකී කැබලි අංක 01 ඉඩමට මායිම්, උතුරට : V. P. අංක 630Aහි කැබලි අංක 82 හා ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : V. P. අංක 630Aහි කැබලි අංක 71 හා පාර ද, දකුණට : පාර සහ V. P. අංක 630A හි කැබලි අංක 29, 30 හා 79 ද, බස්නාහිරට : V. P. අංක 630A හි කැබලි අංක 29 හා 30 ද, කඳුර හා V. P. අංක 630A හි කැබලි අංක 79, 80 හා 82 ද යන සීමාව තුළ පිහිටි එකී අංක 1507 පිඹුරට අනුව අක්කර පහයි පර්චස් තිස් අටයි දශම දෙක (අ. 5, රූ. 0, පර්. 38.2) වපසරියෙන් යුතු ඉඩම, එහි පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියළු දේත් සමග වූ එම කැබලි අංක 1 වේ. මෙය බදුල්ල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ E39/129 යටතේ ලියාපදිංචි කර ඇත.

පිඹුරු අංක 1507 හි කැබලි අංක 1 වශයෙන් සලකුණු කර ඇති එකී ඉඩම් කොටස ඒකාබද්ධ කරන ලද සහ පහත විස්තර කර ඇති ඉඩම් වල මිනුමකි.

01. පෙර කී රිදීමාලියද්දේ පිහිටි "මැදකඩේවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම එහි පිහිටි ගොඩනැගිලි සහ සෑම සියළු දේත් සමග වූ එකී ඉඩම් කොටසට මායිම්, උතුරට : ඩබ්ලිව්. එම්. කරුණාරත්න විකුණුම්කරුට අයිති ඉතිරි ඉඩම් කොටස වෙන් කරන පැලඉණිවැට, නැගෙනහිරට : ප්‍රධාන පාර, දකුණට : කරත්ත පාර සහ ගම්සභා පාර, බස්නාහිරට : ජී. බී. රිදීමාලියද්දගේ ඉඩමේ පැළ ඉණිවැට යන මායිම් තුළ පිහිටි අක්කර දෙකයි රූඩ් දෙකක (අ. 02, රූ. 02, පර්. 00) වපසරියක් ඇති මෙය බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක E29/2009 යටතේ ලියාපදිංචි කර ඇත.

02. පෙර කී රිදීමාලියද්දේ පිහිටි "මැදකඩේවත්ත" නමැති ඉඩමෙන් කොටසක් වූ ඉඩම එහි පිහිටි ගොඩනැගිලි සහ සෑම සියළු දේත් සමග වූ එකී ඉඩම් කොටසට මායිම් උතුරට : කරුණාසුන්දරගේ ඉඩම වෙන් කරන වැටිය සහ ගුණතිලක බණ්ඩාගේ ඉඩම වෙන් කරන වැටිය, නැගෙනහිරට : ගුණතිලක බණ්ඩාගේ ඉඩම් කොටස සහ ප්‍රධාන පාර ද, දකුණට : පුංචිකුමාරිහාමිගේ ඉඩම් කොටසේ දකුණු කොටස වෙන් කරන පැළ ඉණිවැට, බස්නාහිරට : වෙල්වැටිය යන මායිම් තුළ වූ අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් විසිනවයක (අ. 2, රූ. 2, පර්. 29) වපසරියක් ඇති මෙය බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E30/30 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකරු,
බදුල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 24, ආර්. එච්. ගුණවර්ධන මාවත,
බදුල්ල.

08-314

---

### මහජන බැංකුව - මහරගම ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුවේ නමට නීතිඥ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. ජාගොඩ මහත්මිය විසින් සහතික කරන ලද අංක 7006 සහ 2007.01.12 වැනි දින දරන උකස් බැඳුම්කරය මත සහ නීතිඥ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. ඉඳුරුව මහත්මිය විසින් සහතික කරන ලද අංක 3155 සහ 2008.12.30 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, ලියනගේ දොන් උපුල් ඉන්දික මහතා සහ ලියනගේ දොන් අමල් ඉන්ද්‍රජිත් මහතා යන දෙදෙනා විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 7006 සහ 3155 දරන බැඳුම්කර මත රුපියල් හාරලක්ෂ තිස් දහස් තුන්සිය අසූ එකයි ශත හතක (රු. 4,30,381.07) මුදලක් සහ රුපියල් දහඅටලක්ෂ තිස්තුන් දහස් තුන්සිය තිස්තුනයි ශත තිස් පහක (රු. 18,33,333.35) මුදලක් සහ රුපියල් දස ලක්ෂයක (රු. 10,00,000) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් හාරලක්ෂ තිස්දහස් තුන්සිය අසූ එකයි ශත හතක (රු. 4,30,381.07) එකී මුදල ද, රුපියල් දහඅට ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය තිස්තුනයි ශත තිස් පහක (රු. 18,33,333.35) එකී මුදල ද, රුපියල් දස ලක්ෂයක (රු. 10,00,000) එකී මුදල ද 2009.11.16 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් හාරලක්ෂ තිස්දහස් තුන්සිය අසූ එකයි ශත හතක (රු. 4,30,381.07) මුදලක් මත වර්ෂයකට සියයට විසිතුන (23%) බැගින් තවදුරටත් වූ පොළිය ද, 2009.10.29 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් දහඅට ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය තිස්තුනයි ශත තිස් පහක (රු. 18,33,333.35) මුදලක් මත වර්ෂයකට සියයට විසිහත (27%) බැගින් තව දුරටත් වූ පොළිය ද, 2009.12.01 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් දස ලක්ෂයක් (රු. 10,00,000) මුදලක් මත වර්ෂයකට සියයට විසිහත (27%) බැගින් තවදුරටත් වූ පොළිය ද, විකිණීමේ ගාස්තු ද එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද, එදින තෙක් කරනු ලැබ

ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 7006 හා 3155 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**දේපළ සහ පරිශ්‍රය පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මාදිවෙල පිහිටියා වූ ද "ගොරකගහවත්ත" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද අංක 190/10.10.1996 දරන පිඹුරේ ලොට් X ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : ලොට් E1 හා E2 ද, නැගෙනහිරට : ලොට් E2 සහ F2 ද, දකුණට : පාර ද, බස්නාහිරට : (අංක 1963 පිඹුරේ පාර සඳහා වෙන් කිරීම වන) ලොට් G ද මායිම් වන්නා වූ ද, එකී අංක 190 පිඹුරට අනුව, පර්චස් දහයයි දශම එකයි පහක් (අ. 0. රූ. 0, පර්. 10.15) විශාල වූ ද, තලවතුගොඩ පාරේ වරිපනම් අංක 427/12 දරන බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස, එහි පස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M3015/48A යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාපය II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

08-312

---

**මහජන බැංකුව - කතරගම ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.09.25 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව තීරණය කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් ප්‍රසිද්ධ නොතාරිස් ජී. විජේතුංග මහතා විසින් සහතික කරන ලද 2007.01.25 දිනැති අංක 3608 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් හේවා රයිගම් කෝරලේගේ විමල් කැලුම් කුමාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 3608 දරන උකස්කරය යටතේ රුපියල් තිස්හයලක්ෂ දහඅටදහස් හත්සිය පනස් හයයි ශත අසූතුන (රු. 36,18,756.83)ක මුදලක් මහජන බැංකුවට ගෙවීමට ඉතිරිව ඇති බැවින් ද, එකී රුපියල් තිස්හයලක්ෂ දහඅටදහස් හත්සිය පනස් හයයි ශත අසූතුනක් (රු. 36,18,756.83) මුදලක් සඳහා 2009.05.26 දින සිට සියයට දහඅටයි දශම පහ (18.5%) බැගින් පොළිය ද, වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය ද, වෙන්දේසි ගාස්තුව ද වෙන්දේසි දිනය තෙක් යම් ගෙවීමක් කර ඇත්නම් ඒවා ද අඩු කරගෙන අදාල මුදල අයකර ගැනීම සඳහා බදුල්ල බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. ජයතිලක මහතා විසින් එකී අංක 3608 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළින් පහත දෙවන උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තරය**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල කෝරළයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැනට කතරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ කඳසුරිඳුගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දෙටගමුව නමැති ගමේ පිහිටි "දෙටගමුව හේන" නමැති ඉඩමෙන් මැන බෙදා වෙන්කර ගත් වර්ෂ 2005ක් වූ සැප්තැම්බර් මස 12 වැනි දින බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක මහතා විසින් මැන සාදන ලද අංක M/805 දරන පිඹුරුපතේ පෙන්නුම් කෙරෙන කැබලි අංක 01 දරන උතුරට : පාර සහ අ. භූ. පි. 25හි ලොට් අංක 679 දරන ඉඩම ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කොටසක් ද, දකුණට : අ. භූ. පි. 25හි ලොට් අංක 661 දරන ඉඩම ද, බස්නාහිරට : මෙම ඉඩමේම කොටසක් ද මායිම් වූ රූඩ් තුනයි (අ. 0, රූ. 3, පර්. 0) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ඇතුළු සියළු දේත් එකී ඉඩමට පිවිසීම පිණිස ඉහත පිඹුරුපතේ පෙන්නුම් කෙරෙන වැඩිහිටිකන්දට යන පාර දක්වා දිවෙන "පාර" ලෙස සලකුණු කළ කොටසේ මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත ඉඩම මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/M/97/243 දරන පත් ඉරුවේ ලියාපදිංචිව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 119, වැල්ලවාය පාර,
මොණරාගල.

08-315

---

**මහජන බැංකුව - අම්පාර ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.07.31 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කල්මුන ප්‍රසිද්ධ නොතාරිස් එස්. කෝකුලවානි මිය විසින් සහතික කරන ලද 2008.11.26 දිනැති අංක 446 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර ගෙවීම් කඩවත රාබි රණසිංහ ආරච්චිගේ රූපසිංහ යන අය විසින්

පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දහතුන් ලක්ෂ අසූහත් දහස් හයසිය විසිඑකයි ශත හතක (රු. 13,87,621.07) මුදලක් මහජන බංකුවට ගෙවීමට ඇති බැවින් ද, 2009.04.28 වැනි දින සිට වාර්ෂිකව සියයට විසිහය බැගින් (26%) රුපියල් දහතුන් ලක්ෂ අසූහත් දහස් හයසිය විසිඑකයි ශත හතක (රු. 13,87,621.07) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය ද, සහ වෙන්දේසි ගාස්තු සමග අනතුරුව (කිසියම්) ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් දහතුන්ලක්ෂ අසූහත් දහස් හයසිය විසිඑකයි ශත හතක (රු. 13,87,621.07) මුදල අයකර ගැනීම සඳහා මඩකලපුවේ බලයලත් වෙන්දේසිකාර ඇලෙක්සැන්ඩර් එමානුවෙල් කිංග්ස්ටන් තිස්ස වීරසිංහ මහතා විසින් එකී අංක 446 දරන උකස් බැඳුම්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29D වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දමන ප්‍රාදේශීය සභා සීමාව තුළ වූ 18 වැනි කොළනියෙහි පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ජී. අමරදේව මහතා විසින් 2003.06.25 වැනි දින සකස් කරන ලද අංක 863 දරන පිඹුරෙහි කැබලි අංක 1 වශයෙන් වූ (කොටසක්) මහානාගපුර යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට මායිම්, උතුරට : පී. එම්. බංඩාර මැණිකේ විසින් හිමිකම් කියන ඉඩම, නැගෙනහිරට : පී. ටී. පොඩිසිඤ්ඤෝ විසින් හිමිකම් කියන ඉඩම, දකුණට : පාරට වෙන් වූ රක්ෂිතය බටහිරින් පී. එම්. බංඩාර මැණිකේ යන අය විසින් හිමිකම් කියන ඉඩම සහ පාරේ රක්ෂිතය යන මෙකී මායිම් තුළ වූ රූඩ් තුනයි පර්චස් දාහතයි (අ. 0, රූ. 3, පර්. 17) නැතහොත් හෙක්ටයාර් බිංදුවයි දශම තුනයි හතරයි හයයි පහයි (හෙක්. 0.3465) ඉඩම සහ ඒ තුළ වූ ගොඩනැගිලි ආදී සෑම සියලු දේ සමග වේ. මෙය අම්පාර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම්/පත්‍රුරුව අංක ඩී 16/253 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
අම්පාර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අමරතුංග ගොඩනැගිල්ල,
ඩී. එස්. සේනානායක වීදිය,
අම්පාර.

08-319

---

## මහජන බැංකුව - පමුණුගම ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.11.27 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජිත ඒ. ද සිල්වා විසින් සහතික කරන ලද 2005.12.16 දිනැති අංක 2813 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, ජයකොඩි ආරච්චිගේ දොන් ෂර්ලි පැට්‍රික් එම්මානුවෙල් යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක්ලක්ෂ හතලිස් හයදහස් එකසිය පනස්තුනයි ශත හතලිස් නවය (රු. 1,46,153.49) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2009.02.16 දින සිට වර්ෂයකට 16.75% බැගින් රුපියල් එක්ලක්ෂ හතලිස් හයදහස් එකසිය පනස්තුනයි ශත හතලිස් නවය (රු. 1,46,153.49) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ හතලිස් හයදහස් එකසිය පනස් තුනයි ශත හතලිස් නවය (රු. 1,46,153.49) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 2813 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

මෙම දේපළ උකස යටතේම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජිත් ඒ. ද සිල්වා විසින් සහතික කරන ලද 2005.12.16 දිනැති 2814 උකස්කරය යටතේ රු. 3,00,000ක ක්‍රමික ණය මුදලක් ද, 2004.11.25 දින සහතික කරන ලද 1700 උකස්කරය යටතේ රු. 4,00,000ක ක්‍රමික ණය මුදලක් ද, පවතී.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, පමුණුගම ඇලෙන් එගොඩ ග්‍රාමයේ පිහිටි වැටකෙයියා ගහවත්ත නමැති ඉඩමට එම්. ඩී. ජේ. වී. පෙරේරා බලයලත් මිනින්දෝරු විසින් 1985.02.04 දින මැන සකස් කරන ලද 8151 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : වැල්ල පාර සහ මේරි ප්‍රැන්සිස්කා ජයකොඩිගේ ඉඩම ද, නැගෙනහිරට : මේරි ප්‍රැන්සිස්කා ජයකොඩිගේ ඉඩම ද, දකුණට : මේරි තෙරේසා ජයසූරියට සහ තවත් අයට අයත් මේ ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : වැල්ල පාර යන මායිම් තුළ පිහිටි පර්චස් දහසයයි දශම හය (අ. 0, රූ. 0, පර්. 16.6) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක B597/35 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී පිඹුරේ පාරවල් සඳහා වෙන් කළ කොටස්වල මාර්ග අයිතිය ද සමග වේ.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

08-316

### මහජන බැංකුව - කඩුවෙල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.09 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. කේ. එම්. මීගම මහත්මිය විසින් සහතික කරන ලද 2007.06.21 දිනැති අංක 782 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම, කොද්දූරු ආරච්චිගේ වීරපාල මයා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී උකස්කරය යටතේ රුපියල් දෙලක්ෂ විසිතුන් දහස් දෙසිය හැට අටයි ශත හැට නවයක (රු. 2,23,268.69) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2009.06.12 දින සිට වර්ෂයකට සියයට විසිඑක බැගින් (21%) හා රුපියල් දෙලක්ෂ විසිතුන් දහස් දෙසීය හැට අටයි ශත හැට නවයක (රු. 2,23,668.69) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29 වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීම් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී දෙලක්ෂ විසිතුන් දහස් දෙසීය හැට අටයි ශත හැට නවයක (රු. 2,23,268.69) මුදලක් අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. සමන්මලී රාමනායක මහත්මිය විසින් එකී අංක 782 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ අංගොඩ, උඩුමුල්ල, මාලිගාගොඩැල්ල, දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක සී. ද එස්. ගුණතිලක මහතා විසින් 1994.02.05 වැනි දින මැන සකස් කරන ලද අංක 2170 දරන සැලැස්මේ කැබලි අංක 02ට මායිම්, උතුරට : අඩි 10ක් පළල පාර ද, නැගෙනහිරට : කැබලි අංක 01 ද, දකුණට : කැබලි අංක 01 ද, බස්නාහිරට : අඩි 15ක් පළල පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10)ක් විශාල බිම් කොටස සහ එහි තුළ පිහිටි නිවස, ගහකොළ, පළතුරු යනාදී සියලුම දේද වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 1019/01 යටතේ ලියාපදිංචි වී ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කළාප II.

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත, මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

08-317

### මහජන බැංකුව - දෙහිඕවිට ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.04.29 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස්, ඩී. එම්. සුසිල් හේරත් මහතා විසින් සහතික කරන ලද 2008.06.04 දිනැති අංක 740 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම අංක 39, ඉහළ තල්දූව, අවිස්සාවේල්ල යන ලිපිනයෙහි පදිංචි වත්තේගම තලන්තානි රාලලාගේ සරත් රාජකරුණා යන අය විසින් පැහැර හැර ඇති බැවින්, එකී උකස්කරය යටතේ පිළිවෙලින් රුපියල් පන්ලක්ෂය (රු. 5,00,000) ක මුදලක් සහ රුපියල් තුන්ලක්ෂ පනස්හත්දහස් දෙසීය (රු. 3,57,200) ක මුදලක් හා පිළිවෙලින් 2009.04.01 දින සිට වර්ෂයකට සියයට විසිතුන (23%) සහ 2010.01.10 දින සිට වර්ෂයකට සියයට විසිදෙක (22%) බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ ඉහත කී මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකර ගනු ලැබිය හැකි මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී ණය මුදල් සඳහා රුපියල් පන්ලක්ෂය (රු. 5,00,000) සහ රුපියල් තුන්ලක්ෂ පනස්හත්දහස් දෙසීයය (රු. 3,57,200) අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර සීමාසහිත ඩලස් කෙලාර්ට්ස් පුද්ගලික සමාගම විසින් එකී අංක 740 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බටහිර අටුලුගම් කෝරළේ, දෙහිඕවිට ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉහල තල්දූව ගමේ පිහිටි මඩිතිය අරඹ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එම්. ගමගේ මහතා විසින් 1992.01.12 දින මැන සාදන ලද අංක 736 දරන පිඹුරු පතේ පෙන්නුම් කෙරෙන ලොට් අංක 01 සිට 07 දක්වා ඒකාබද්ධ ඉඩම් වන රූඩ් එකයි පර්චස් එකොළහක් (අ. 0. රූ. 1, පර්. 11) වපසරිය ඇති දේපළට මායිම්, උතුරට : පාලුවත්ත හෙවත් පරණවත්ත සහ වේයන්ගල ද, නැගෙනහිරට : වේයන්ගල ද, දකුණට : ඉහත කී පිඹුරේ ලොට් අංක 08 ද, බස්නාහිරට : ගම්සභා පාර ද යන මායිම් තුළ ඇති ඉඩම සහ ඒ තුල ඇති ගොඩනැගිලි/ගසකොළ පළතුරු ආදී සියළු දේද වේ.

මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක Q148/18 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කෑගල්ල.

08-318

### මහජන බැංකුව - මොරටුව ශාඛාව

#### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.09 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රියන්ති ලියනගේ මහත්මිය විසින් සහතික කරන ලද 2009.08.24 දිනැති අංක 3576 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් සේනානායකගේ සුරංජන් ඩිලන්තා සිල්වා මයා, විදානලාගේ චන්ද්‍රලතා මාලනී ද මැල් මිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද. එකී උකස්කරය යටතේ දැනට රුපියල් හත්ලක්ෂ තිස්පන් දහස් දෙසිය පනස් හතරයි ශත තිස්එකක (රු. 7,35,254.31) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2009.09.23 දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් හත්ලක්ෂ තිස්පන් දහස් දෙසිය පනස් හතරයි ශත තිස්එකක (රු. 7,35,254.31) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හත්ලක්ෂ තිස්පන් දහස් දෙසිය පනස් හතරයි ශත තිස්එකක (රු. 7,35,254.31) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 3576 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

1. බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පානදුර තල්පිටි දෙබැද්දේ කෙසෙල්වත්ත ප්‍රාදේශීය සභා සීමාව තුළ හොරේතුඩුව නාගවරාය පාර පිහිටි ''නාගහවත්ත හෙවත් නාගහදෙනිය'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ජී. ඩී. අර්සකුලරත්න මහතා විසින් 2006.07.15 වැනි දින මැන සාදන ලද අංක 400 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් අංක B2A දරන කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද. නැගෙනහිරට : 2629 දරන පිඹුරේ දැක්වෙන B3 සහ B4 දරන කැබලි ද, දකුණට : නාගවරාය පාරේ වරිපනම් අංක 42/1 දරන දේපළ සහ ලොට් A හි කොටසක් ද, බස්නාහිරට : අගල සහ පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තුනයි දශම එකයි අටක් (අ. 0, රූ. 0, පර්. 3.18) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියළු දේද වේ.

පහත සඳහන් මාර්ග අයිතිවාසිකම් ද සමග වේ :-

1. ඉහත කී හොරේතුඩුව නාග වරාය පාර පිහිටි ''නාගහවත්ත හෙවත් නාගහදෙනිය'' නමැති ඉඩමෙන් මෙම බිම් කට්ටියට නාගවරාය පාර සම්බන්ධ කරමින් බලයලත් මිනින්දෝරු සී. ඩබ්. ද මැල් මහතාගේ අංක 1532B දරන පිඹුරේ අංක G දරන පාරක් සඳහා වෙන් කළ කොටසට මායිම්, උතුරට : පානදුර ගඟ ද, නැගෙනහිරට : අංක E, F සහ A දරන කට්ටි ද, දකුණට : මෙම ඉඩමේ අංක A දරන කට්ටිය ද, බස්නාහිරට : අංක A, B සහ D දරන කට්ටිය ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් පහයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 5.4)ක් විශාල බිම් තීරය පොදුවේ පාරක් වශයෙන් පරිහරණය කිරීමේ අයිතිවාසිකම ද සමග වේ.

2. ඉහත කී හොරේතුඩුව, ''නාගවරාය පාර පිහිටි නාගගහවත්ත හෙවත් නාගහදෙනිය'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. සී. ආර්. ප්‍රනාන්දු මහතාගේ අංක 2629 දරන පිඹුරේ අංක B4 දරන අඩි 4ක් පළල පාරක් සඳහා වෙන් කළ කොටසට මායිම්, උතුරට : අංක B1 ද, නැගෙනහිරට : අංක 7 සිට 10 දක්වා පළලැති පාර ද, දකුණට : අංක B3 දරන දේපළ ද, බස්නාහිරට : අංක B2 දරන කට්ටිය ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් බින්දුවයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 0.5)ක් විශාල බිම් තීරය පොදුවේ පාරක් වශයෙන් පරිහරණය කිරීමේ අයිතිවාසිකම ද සමග වේ.

මෙම උකස්කරය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක F521/244, 599/5, 538/167හි ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කළාප II.

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත, මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

08-310

---

### ලංකා බැංකුව

#### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2008.11.28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ඩී. වීරසූරිය විසින් සහතික කරන ලද 2003.04.07, 2004.07.26. 2006.04.10 වැනි දිනැති අංක 1585, 83, 656 දරන බැඳුම්කර මත මුල් මුදල, පොළිය හා ණය මත 2008.10.12 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් දෙලක්ෂ හැටතුන් දහස් නවසිය හැටතුනයි ශත තිස්දෙකක (රු. 2,63,963.32) මුදලක් සමග ස්ථිර අයිරා මත රුපියල් එකොලොස් ලක්ෂ පනස් හත් දහස් හත්සිය හතලිස් තුනයි ශත හැටපහක (රු. 11,57,743.65) මුදලක් සහ ණය ගිණුම මත රුපියල් දෙලක්ෂයයි ශත දොළහක් (රු. 2,00,000.12) සහ ස්ථිර අයිරා ගිණුම මත රුපියල් දස ලක්ෂයක් (රු. 10,00,000) ක මුදලක් මත වසරකට සියයට විසිනවය (29%) බැගින් පොළියක් ද, 2008.10.13 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක්, කොළඹ 06, කිරුළපන, රොබට් ගුණවර්ධන මාවතේ, හි පදිංචි බියගම ආරච්චිගේ ශ්‍රියාරත්න මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1585, 83, 656 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු එකී ඉහත ''1'' හි සඳහන් මුදල සමග විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවියයුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3හි පදිංචි වෙන්දේසිකාරවරු වන ටී. ඇන්ඩ් එච්.

ඔක්ෂන්ස් හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාවේ පිහිටි කිරුළපන රොබට් ගුණවර්ධන මාවතේ පිහිටි තක්සේරු අංක 100/20 දරන බලයලත් මිනින්දෝරු ජේ. එම්. වී. සමරනායක විසින් සාදන ලද 1993 ජුනි මස 10 දිනැති අංක 202 දරන පිඹුරෙහි ලොට් 5043 ලෙස දක්වා විස්තර කර ඇති ගොඩපර, ගහවත්ත, නාරංගහවත්ත, බක්මීගහඕවිට, අඹගහවත්ත, ගොරකගහවත්ත, ඊරියගහඕවිට, මිදෙල්ල ගහ ඕවිට, දියාපෝසිගහ ඕවිට, කජුගහඕවිට, නාගහ ඕවිට, හල්ගහවත්ත, මාදංගහවත්ත හෙවත් දෙල්ගහකනත්ත, කහටගහ ඕවිට, බුළුගහවත්ත, මිල්ලගහවත්ත, කුරුණාඕවිට, ඉඳිගහඕවිට, කහටගහවත්ත, ගොඩපරගහවත්ත, කැප්පකහටගහවත්ත සහ බෙල්ලපොකුණවත්ත යැයි කියන බෙදූ ඉඩම් කැබැල්ල උතරට : ලොට් 1718බී සහ 1718 ද, නැගෙනහිරට : ලොට් 1718 සහ 1723 (පාර) ද, දකුණට : ලොට් 5042 ද, බස්නාහිරට : ලොට් 5042 සහ 1718බී ද මායිම් ව එකී අංක 202 දරන පිඹුර ප්‍රකාර පර්චස් හයයි දශම බිංදුවයි නවයක (රූ. 0, රූ. 0, පර්. 6.09) බිම් ප්‍රමාණයෙන් යුක්තවන අතර එහි ඇති ගොඩනැගිලි සහ සියළු දේද අයත් වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කිරි 123/126හි ලියාපදිංචි කර ඇත.

පී. වීරසිංහ,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණිය ශාඛාව,
නුගේගොඩ.

08-330

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 394405.
ගිණුම් අංකය : 1070025032.
මොරවකගේ චන්දන ජයන්ත පෙරේරා.

2009 ජූලි මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙලෙස නිශ්චය කරන ලදී.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. සෙනරත් විසින් 2007 සැප්තැම්බර් මස 24 වැනි දින සහතික කරන ලද අංක 5309 සහ මාතර ප්‍රසිද්ධ නොතාරිස් ටී. දිසානායක විසින් 2007 දෙසැම්බර් මස 19 වැනි දින සහතික කරන ලද අංක 20044 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලිහිණි එන්ට(ර්) ප්‍රයිසස් යන ව්‍යවහාර ව්‍යාපාර නාමය යටතේ තනි අයිතිකාර වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන මොරවකගේ චන්දන ජයන්ත පෙරේරා ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසිපන් ලක්ෂ හැත්තෑහයදහස් දහනවයයි ශත හැත්තෑපහක (රු. 25,76,019.75) මුදලක් 2009 අප්‍රේල් මස 20 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් විසිපන් ලක්ෂ හැත්තෑහයදහස් දහනවයයි ශත හැත්තෑපහක (රු. 25,76,019.75) මුදල අයකර ගැනීම සඳහා 2009 අප්‍රේල් මස 21 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 11,45,197.37ක මුදල මත 36%කට වැඩිදුර වාර්ෂික පොළිය සහ රු. 11,75,318.47ක මුදල මත 18%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබා ගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 5309 සහ 20044 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරගනු ලබයි.

### උපලේඛනය

අනුඥාලත් මිනින්දෝරු ඒ. සමරක්කොඩි විසින් 1996 මාර්තු මස 19 වැනි දින සාදන ලද පිඹුරු අංක 346හි දැක්වෙන දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළය තුළ අකුරුගොඩ සහ උරුවිටිකේ පිහිටි දිවියාගලහේන කියන ඉඩමේ පස්බිම් සහ වගාවන් සියළුම ගොඩනැගිලි සහිතව එහි පවත්නා අනෙකුත් සියළු දේත් යන සියල්ල එක්ව වෙන්කර ලොට් 12 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : අනුඥාලත් මිනින්දෝරු ඒ. සමරක්කොඩි විසින් 1994 මැයි මස 23 වැනි දින සාදන ලද පිඹුරු එකී අංක 181හි සඳහන් එම ඉඩමේම ලොට් 13 ද, නැගෙනහිරට : පෙර කී පිඹුරු අංක 181හි සඳහන් එම ඉඩමේම ලොට් B3 ද, දකුණට : පෙර කී පිඹුරු අංක 181හි සඳහන් එම ඉඩමේම ලොට් 11 ද සහ බස්නාහිරට : වත්තේ පාර ද යන මායිම් තුළ පෙර කී එකී පිඹුරු අංක 346ට අනුව රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) හෝ හෙක්ටයාර් 0.1012ක් විශාල ඉඩම. මාතර දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ යොමු අංක D924/260 යටතේ ලියාපදිංචි කර ඇත.

පෙර කී පිඹුරු අංක 346හි දැක්වෙන (අඩි 18ක් පළල) වත්තේ පාර මතුපිටින් යාමේ අයිතිය ද එක්ව ය.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

08-292

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : ජීඑල්/08/01060/ජීඒ1/607.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.01 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ජී. එස්. එස්. කේ. අබේවික්‍රම විසින් සහතික කරන ලද 2006.04.26 වැනි දින හා අංක 236 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, බද්දේගම පදිංචි තුඩුවේ කංකානම්ගේ නොෂාන් චතුර කුමාර සහ අනෝජා ගී ෂානි මාසකෝරාල යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.02.26 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ පනස් අටදහස් තුන්සිය විස්සයි ශත හතලිස් අටක (රු. 3,58,320.48) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 236 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හතලිස් හතයි ශත විසිපහ (147.25) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න).

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර, කොටුව, ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගාල්ල දිස්ත්‍රික්කයේ, උතුරු ගඟබඩ පත්තුවේ, උනන්විටිය පිහිටි මහදෙල්හිටිදූව ඉඩමට 2001 ජූනි මස 29, 2001 මාර්තු මස 27, 2001 ජූනි මස 23 වැනි දින බලයලත් මිනින්දෝරු ඒ. වීරසිංහ විසින් මැන සකසන ලද අංක 318ඒ දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 10.25 හෝ හෙක්. 0.1271ක් බිම් කොටස සමග සියලු දේත් සමග වේ.

මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ 48/252 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස අංක 318ඒ දරන පිඹුරේ මාර්ග අයිතිය ද සමග වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජූලි මස 29 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

08-263/1

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : කේයූ/17/1399/කේයූ1/547.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.01 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. සී. ජයසිංහ විසින් සහතික කරන ලද 2007.07.18 දින හා අංක 1015 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කැකිරාව පදිංචි ඉලංගසිංහ දිසානායක ධම්මිකා රංජනී ඉලංගසිංහ සහ නීල් රොහාන් දිසානායක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.02.26 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් අටලක්ෂ හැටපන් දහස් අටසිය හැට නවයයි ශත අනූ හත (රු. 8,65,869.97)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1015 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් හාරසිය පනහයි ශත හැත්තෑතුන (රු. 450.73) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න).

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කුරුණෑගල, වටරවුම් පාර, මල්කඩුවාව, ගම්මඩුගොල්ල මාවත, අංක 12හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, දකුණු මාමිණිය කෝරළේ, කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 618, ඔළුකරඳ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඔළුකරඳ ගමේ පිහිටි වීබැන්දගල මූකලාන නම් ඉඩමට 1998.07.11 දින බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් සකස් කරන ලද අංක 98/39 මිණුම් පිඹුරට අනුව කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 2, පර්. 7.6ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 645/121හි ලියාපදිංචි වී ඇත.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජූලි මස 29 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

08-263/2

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ගිණුම් අංකය : 1333172501.

ණය ගිණුම් අංකය : 208277.
ඇත්මඩලගේ විජේප්‍රිය සිල්වා.

2009 දෙසැම්බර් මස 23 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඩී. එච්. ඉසෙඩ්. ප්‍රනාන්දු විසින් 1998 දෙසැම්බර් මස 01 වැනි දින සහතික කරන ලද අංක 7124 දරන බැඳුම්කරය ද, මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එල්. පී. ඊ. කරුණාරත්න විසින් 2000 ජුනි මස 26 වැනි දින සහතික කරන ලද අංක 13912 දරන බැඳුම්කරය සහ ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. සී. පී. ගනේපොල විසින් 2001 දෙසැම්බර් මස 12 වැනි දින සහතික කරන ලද අංක 5542 සහ 2003 මාර්තු මස 03 වැනි දින සහතික කරන ලද අංක 6519 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ඇත්මඩලගේ විජේප්‍රිය සිල්වා ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් මිලියන දෙකක් සහ පන්සිය අනූහයදහස් හාරසිය දහසයයි ශත දහහතරක (රු. 25,96,416.14) මුදලක් 2009 අගෝස්තු මස 12 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් මිලියන දෙකක් සහ පන්සිය අනූහයදහස් හාරසිය දහසයයි ශත දහහතරක (රු. 25,96,416.14) මුදල අයකර ගැනීම සඳහා 2009 අගෝස්තු මස 13 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 18,82,715.93ක මුදල මත 22%කට වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් දරන ලද වෙනත් වියදම් වෙතොත් ඒවාද මෙතෙක් ලබා ගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 7124, 13912, 5542 සහ 6519 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූද, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනා සම්මත කරගනු ලබයි.

### උපලේඛනය

අනුග්‍රහලත් මිනින්දෝරු ඩබ්ලියු. ඩී. එන්. සෙනෙවිරත්න විසින් 1991 ජුලි මස 26 වැනි දින සාදන ලද අංක 1085 දරන පිඹුරෙහි දැක්වෙන බස්නාහිර පළාතේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසය තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, නිල්පනාගොඩ පිහිටි කහටගහලන්ද සහ දෙල්ගහවත්ත හෙවත් කහටගහලන්ද සහ දොඹගහවත්ත කියන ඉඩමේ වෘක්ෂයන්, වගාවන් සහ එහි පවත්නා අනෙකුත් සියළු දේත් සමග බෙදා වෙන්කර ලොට් 5 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 4 ද, නැගෙනහිරට : ලොට් 6 ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර ද සහ බස්නාහිරට : මිලිනෝනාගේ ඉඩම ද යන මායිම් තුළ පර්චස් දහඅටයි දශම එකයි අටක් (අ. 0, රූ. 0, පර්. 18.18) විශාල ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C855/195 වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

08-288

---

### මහජන බැංකුව - මීරිගම ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.26 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2008.11.11 දිනැති අංක 14058 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, විජේසුන්දර ලේකම්ලාගේ ක්‍රිෂ්ණා නිශාන්ති යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක දරන උකස්කරය යටතේ දැනට රුපියල් හයලක්ෂ අනූතුන් දහස් එකසිය විසි නවයයි ශත පනස් නවය (රු. 6,93,129.59) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2009.06.02 දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් හයලක්ෂ අනූතුන් දහස් එකසිය විසි නවයයි ශත පනස් නවය (රු. 6,93,129.59) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හයලක්ෂ අනූතුන් දහස් එකසිය විසිනවයයි ශත පනස් නවය (රු. 6,93,129.59) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩලස් කෙලාට්ස් (පුද්ගලික) සමාගම විසින් එකී අංක 14058 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, යටිගහ පත්තුවේ සහ සියනෑ කෝරළේ, මැද පත්තුවේ, වේරගොඩ, වේබඩමුල්ල කුඹල්ඔළුව එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක ජේ. පී. අයි. අබේකෝන් 1996.08.15 දින සකස් කරන ලද අංක 4685 දරන අයි. කොටඹගේ සහතික කරන ලද පිඹුරට අනුව ලොට් අංක 14ට මායිම්, උතුරු-නැගෙනහිරට : පිඹුරු අංක 4222 ලොට් 5ඒ, දකුණු-නැගෙනහිරට : ලොට් අංක 12, දකුණු-බටහිරට : ලොට් අංක 13, උතුරු-බටහිරට : ලොට් අංක 15 යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොව (අ. 0, රූ. 0, පර්. 15)ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 937/01හි ලියාපදිංචි කර ඇත.

එකී පිඹුරේ සඳහන් මර්ගයන්හි මාර්ග අයිතීන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

08-309

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එස්. කේ. අබයනායක.
ගිණුම් අංක : 0090 5000 1617.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ මාර්තු මස 25 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. කේ. විබැද්ද යන අය විසින් ලියා සහතික කරන ලද 2007 දෙසැම්බර් මස 27 දාතම හා අංක 1078 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සිසිර අබයනායක අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හත්ලක්ෂ අනූනය දහස් තුන්සිය අසූතුනයි ශත විසිහතක (රු. 7,96,383.27) මුදලක් 2010 පෙබරවාරි 11 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හත්ලක්ෂ අනූනය දහස් තුන්සිය අනූතුනයි ශත විසිහතක (රු. 7,96,383.27) මුදල ද 2010 පෙබරවාරි 12 වැනි දින සිට අංක 1078 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත්ලක්ෂ හත්දහස් නමසිය තිස් හතයි ශත අනූතුනක (රු. 7,07,937.93) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිදෙකක් (22%) බැගින් පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 1078 දරන එකී බැඳුම්කරය මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නෙගම්පහ කෝරළේ, කලගම් පත්තුවේ, ගල්නෑව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ගලේගොඩ කඳු තුලන වෙරුන්කුලම පිහිටි "ගොඩගම ඉඩමේ කොටසක් වශයෙන් ද හඳුන්වනු ලබන" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. බී. ඉලංගසිංහ යන අය විසින් සාදන ලද 2007 ඔක්තෝබර් මස 20 දාතම හා අංක 2007/AN/730 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ආර්. බී. දිසානායක යන අයගේ ඉඩම, නැගෙනහිරට : ආර්. බී. දිසානායක, පී. ඩී. ද සිල්වා සහ කේ. සුබ්‍රම්නියම් යන අයගේ ඉඩම්, දකුණට : දුම්රිය මාර්ගය සඳහා වෙන් කිරීම සහ බස්නාහිරට : වෙරුන්කුලම වැව සඳහා වෙන් කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විසිහතරක් (අ. 1, රූ. 3, පර්. 24) හෝ හෙක්ටයාර් 0.7689ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2007/AN/730 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව බී 201/110 යටතේ අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී ගලේගොඩ කඳු තුලන වෙරුන්කුලම ඉඩමේ කොටසක් වශයෙන් හඳුන්වනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සහතික කරන ලද F. V. P. 858 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 31D වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : තේමිස් අප්පු යන අයගේ ඉඩම, නැගෙනහිරට : පාලගම-නැගම පාර සඳහා වෙන් කිරීම, දකුණට : දුම්රිය මාර්ගය සඳහා වෙන් කිරීම සහ බස්නාහිරට : වෙරුන්කුළම වැව සඳහා වෙන් කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් දිගින් අඩි පන්සිය අසූ දෙකක් සහ පළලින් අඩි එකසිය තිස් නමයක් (582X139) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක F. V. P. 858 දරන පිඹුරට අනුව ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-367/8

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ඩබ්ලිව්. ඒ. එම්. එස්. වලිමුණි සහ කේ. එම්. ඩී. ඩී. පී. සිරිසේන
ගිණුම් අංක : 0090 5000 0386.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 ඔක්තෝබර් මස 17 දාතම හා අංක 1589 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වලිමුණි ආරච්චිලාගේ මංජුල සම්පත් වලිමුණි සහ කුමාරසිංහ දිසානායකගේ දිනේෂා ප්‍රේමකුමාරි නොහොත් කුමාරසිංහ දිසානායකගේ දිනේෂා ප්‍රේමකුමාරි සිරිසේන යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී කුමාරසිංහ දිසානායකගේ දිනේෂා ප්‍රේමකුමාරි නොහොත් කුමාරසිංහ දිසානායකගේ දිනේෂා ප්‍රේමකුමාරි සිරිසේන උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ

වලංගු මුදලින් රුපියල් හාරලක්ෂ අසූහය දහස් හත්සිය පනස් හතරයි ශත හැටතුනක (රු. 4,86,754.63) මුදලක් 2009 සැප්තැම්බර් 11 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හාරලක්ෂ අසූහය දහස් හත්සිය පනස් හතරයි ශත හැටතුනක (රු. 4,86,754.63) මුදල ද 2009 සැප්තැම්බර් 12 වැනි දින සිට අංක 1589 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාරලක්ෂ එක්දහස් හැත්තෑ හතරක (රු. 4,01,074) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිදෙකක් (22%) බැගින් පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 1589 දරන එකී බැඳුම්කරය මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමාවත් තුළ බෝපත්ත ග්‍රාමයේ පිහිටි "තෝරපලාවේ වත්ත (කොටසක්)" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. රත්නම් යන අය විසින් සාදන ලද 2000 මාර්තු මස 21 දාතම හා අංක 7679 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් ඒ වශයෙන් ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම්. කේ. සීමන් විසින් හිමිකම් කියුන ලබන ඉඩම සහ ටී. පී. තමාරිස් විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : ටී. පී. තමාරිස් විසින් හිමිකම් කියනු ලබන ඉඩම, ඇල සහ එච්. කේ. කුලරත්න විසින් හිමිකම් කියනු ලබන ඉඩම, දකුණට : එම්. කේ. කුලරත්න විසින් හිමිකම් කියනු ඉඩම, එච්. පී. විමලසේනගේ ඉඩම සහ මහා මාර්ග සහ බස්නාහිරට : මහා මාර්ග සහ එම්. කේ. සීමන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස්හතයි දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 37.10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග අංක 7679 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව වී 103/266 අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-367/6

---

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

රණශ්‍රී මැනේජ්මන්ට් සෙන්ටර්.
ගිණුම් අංක : 1052 1319 1278.

සීමාසහිත සම්පත් බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ ජූනි මස 24 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පී. කිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2006 ඔක්තෝබර් මස 20 දාතම හා අංක 1734 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට එහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනරජයේ "රණශ්‍රී මැනේජ්මන්ට් සෙන්ටර්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන හවුල් ව්‍යාපාරයේ අයිතිකරුවන් වන හේවා කුඹල්ගොඩ ගමගේ ශ්‍රියානි රණසිංහ සහ රණසිංහ ආරච්චිගේ දොන් සමන් මංගල රණසිංහ යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී හේවා කුඹල්ගොඩ ගමගේ ශ්‍රියාණි රණසිංහ උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පනස්හතර ලක්ෂ අසූහතර දහස් පන්සිය හැත්තෑ නමයයි ශත හැත්තෑහයක (රු. 54,84,579.76) මුදලක් 2010 පෙබරවාරි 18 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පනස්හතර ලක්ෂ අසූහතර දහස් පන්සිය හැත්තෑ නමයයි ශත හැත්තෑහයක (රු. 54,84,579.76) මුදල ද 2010 පෙබරවාරි 19 වැනි දින සිට අංක 1734 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් පනස්එක් ලක්ෂ අනූනම දහස් එකසිය හතලිස් හයයි ශත විසිහයක (රු. 51,99,146.26) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 1734 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම මහ නගර සභා සීමාවත් තුළ කොට්ටාව පිහිටි "ගොඩපොරගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. ඩබ්ලිව්. අබේසිංහ යන අය විසින් සාදන ලද 1998 දෙසැම්බර් මස 29 දාතම හා අංක 4062 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 5 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඩී. රණසිංහ මහත්මියගේ ඉඩම, නැගෙනහිරට : අමරසේකර මහත්මියගේ ඉඩම, දකුණට : ආර්. දොන් සේදිරිස් රණසිංහ යන අයගේ ඉඩම සහ බස්නාහිරට : ලොට් 4ස හ 6 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහයි දශම දෙකයි පහක් (අ. 0. රූ. 0, පර්. 30.25) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්. ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයක් ද සමග එකී අංක 4062 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G1681/15 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍ඉරුව G1584/127 යටතේ ලියාපදිංචි කොට ඇති හා අංක 4062 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 6 (අඩි 10 පළල පාර සඳහා වෙන් කිරීම)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-367/14

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එස්. එස්. පේමවතී නොහොත් ආර්. එස්. ප්‍රේමවතී සහ එච්. ජී. යූ. ප්‍රියන්ත.
ගිණුම් අංක : 1014 5341 2770.

සීමාසහිත සම්පත් බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ ජුනි මස 24 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පී. කිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. හේවාවිතාරණ යන අය විසින් ලියා සහතික කරන ලද 2008 ජූලි මස 07 දාතම හා අංක 1302 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට එහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුහසිං සිරිවර්ධන පේමවතී නොහොත් රූබසිං සිරිවර්ධන ප්‍රේමවතී සහ හොරගල ගමගේ උපුල් ප්‍රියන්ත යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී සුහසිං සිරිවර්ධන පේමවතී නොහොත් රූබසිං සිරිවර්ධන ප්‍රේමවතී උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහනම ලක්ෂ අසූහත් දහස් අටසිය හැට හතරයි ශත හැට අටක (රු. 19,87,864.68) මුදලක් 2010 අප්‍රේල් මස 15 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දහනම ලක්ෂ අසූහත් දහස් අටසිය හැට හතරයි ශත හැට අටක (රු. 19,87,864.68) මුදල ද 2010 අප්‍රේල් 16 වැනි දින සිට අංක 1302 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් දහඅටලක්ෂ විසි හත්දහස් පන්සිය අනූවය ශත හැටක (රු. 18,27,590.60) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහඅටක් (18%) බැගින් පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 1302 දරන එකී බැඳුම්කරය මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, බස්නාහිර මොරවක් කෝරලේ, හොරගල පිහිටි "ඉලුක්තැන්න නොහොත් බෙරළුවහේන" යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සාදන ලද 1970 අගෝස්තු මස 12 දාතම හා අංක F. V. P. අංක 16හි නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 372 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : F. V. P අංක 16හි ලොට් $27^{AN}$, නැගෙනහිරට : F. V. P අංක 16හි ලොට් $28^{B}$, දකුණට : F. V. P අංක 16හි ලොට් 373, බස්නාහිරට : F. V. P අංක 16හි ලොට් $27^{E}$ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් විසි අටක් (අ. 1, රූ. 0, පර්. 28) විශාල ඉඩම් කොටස සමග සම්පූර්ණයෙන් පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයක් ද සමග වෙළුම/පත්‍ඉරුව LDO reference බ18/01 යටතේ මොරවක ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 372 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටස බලයලත් මානක තැන අයි. කොටඹගේ යන අය විසින් සාදන ලද 2007 අගෝස්තු මස 08 දාතම හා අංක 221 දරන පිඹුරේ නිරූපිත ලොට් 372 වශයෙන් දැන් ලකුණුකොට ඇති අතර එහි හා නැවත මිණුමකි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-367/13

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

බී. එච්. නන්දසේන.
ගිණුම් අංක : 1017 5014 1774.

සීමාසහිත සම්පත් බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ ජුනි මස 24 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පී. කිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර යන අය විසින් ලියා සහතික කරන ලද 2004 නොවැම්බර් මස 03 දාතම හා අංක 2993 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට එහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බදුගම හේවගේ නන්දසේන යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී

බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැත්තෑ අටදහස් අටසිය තිස්තුනයි ශත පනස් හතක (රු. 78,833.57) මුදලක් 2010 ජනවාරි 20 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හැත්තෑ අටදහස් අටසිය තිස්තුනයි ශත පනස් හතක (රු. 78,833.57) මුදල ද 2010 ජනවාරි 21 වැනි දින සිට අංක 2993 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් හැටනම දහස් එකසියයි ශත හැට එකක (රු. 69,100.61) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 2993 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ කටුකුරුන්දවත්ත වෝඩ් අංක 20 කවුඩාන හි වටරප්පල පාර (අබේසේකර පාර) හි පිහිටි අබේසේකර පාර, වරිපනම් අංක 120/41 දරන "දිවලකුඹුර" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වී. පී. සමරවීර යන අය විසින් සාදන ලද 1990 අගෝස්තු මස 24 දාතම හා අංක 3057 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 10A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1942 දරන පිඹුරේ ලොට් 9 සහ අංක 3057A දරන එකී පිඹුරේ ලොට් 5A, නැගෙනහිරට : අංක 3057 දරන පිඹුරේ ලොට් 10B, දකුණට : මුල්වක්කඩකුඹුර සහ බස්නාහිරට : ජී. ඕ. ආර් සිල්වා යන අයගේ අංක 1942 දරන පිඹුරේ ලොට් S5 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම තුනයි පහක් (අ. 0, රූ. 0, පර්. 8.35) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 3057 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව M1955/273 යටතේ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-367/12

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ආර්. එම්. ආර්. රත්නායක
ගිණුම් අංක : 0090 5000 0173.

සීමාසහිත සම්පත් බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ ජූනි මස 24 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පී. කිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. කේ. වීබැද්ද යන අය විසින් ලියා සහතික කරන ලද 2008 ජූලි මස 14 දාතම හා අංක 1300 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට එහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රත්නායක මුදියන්සේලාගේ රත්නසිරි රත්නායක යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැටපස් ලක්ෂ නමදහස් හයසිය හැටඑකයි ශත එකක (රු. 65,09,661.01) මුදලක් 2010 අප්‍රේල් මස 07 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හැටපස් ලක්ෂ නමදහස් හයසිය හැටඑකයි ශත එකක (රු. 65,09,661.01) මුදල ද 2010 අප්‍රේල් 08 වැනි දින සිට අංක 1300 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් පනස් නම ලක්ෂ අනූඑක් දහස් පන්සිය දෙකයි ශත එකොළහක (රු. 59,91,502.11) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි හතරක් (24%) බැගින් පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 1300 දරන එකී බැඳුම්කරය මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ. මාතලේ උතුරු කෝරළේ, වගපනහා පල්ලේසිය පත්තුවේ, දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පාදෙණිය ග්‍රාමයේ පිහිටි "දෙමළිදවපුයාය හි කොටසක් " යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. එම්. අනුරරත්න යන අය විසින් සාදන ලද 2005 සැප්තැම්බර් මස 25 දාතම හා අංක 4579 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 5 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඒ. ජී. එස්. බාලකුමාර් යන අයගේ දෙමළිදවපුයාය දේපළ, නැගෙනහිරට : කුරුණෑගල සිට දඹුල්ල දක්වා මහා මාර්ගය, දකුණට : බී. එම්. සෝමරත්න සහ වෙනත් අයට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : පැල ඉණී වැට සහ කිරිමැණිකා යන අයගේ වරයාය දේපළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනක් (අ. 0, රූ. 3, පර්. 0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4579 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D 506/87 යටතේ මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-367/10

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ආර්. එම්. ඒ. යූ. රත්නායක සහ ආර්. එම්. සී. එන්. රත්නායක.
ගිණුම් අංක : 0006 5005 0746.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ අප්‍රේල් මස 27 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පී. කිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. එස්. කල්හාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2008 පෙබරවාරි මස 14 දාතම හා අංක 80 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට එහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රත්නායක මුදියන්සේලාගේ අනුරාධ උපුල් රත්නායක සහ රත්නායක මුදියන්සේලාගේ චමිලා නිරෝෂනි රත්නායක යන අය බන්ධනදායීන් වශයෙන් සහ එකී රත්නායක මුදියන්සේලාගේ චමිලා නිරෝෂිනි රත්නායක යන අය උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දාහත් ලක්ෂ හැත්තෑහතර දහස් අසූඑකයි ශත අසූඅටක (රු. 17,74,081.88) මුදලක් 2010 පෙබරවාරි 11 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දාහත් ලක්ෂ හැත්තෑහතර දහස් අසූඑකයි ශත අසූඅටක (රු. 17,74,081.88) මුදල ද 2010 පෙබරවාරි 12 වැනි දින සිට අංක 80 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් දහතුන් ලක්ෂ අසූපන් දහසක (රු. 13,85,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි දෙකක් (22%) බැගින් පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 80 දරන එකී බැඳුම්කරය මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ, කුඩාගල්බොඩ කෝරළේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ තිත්තවැල්ල ග්‍රාමයේ පිහිටි "බුළුගහමුලහේන දැන් වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩබ්ලිව්. ආරියරත්න යන අය විසින් සාදන ලද 2002 මාර්තු මස 03 දාතම හා අංක 53/2002 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1482 දරන පිඹුරේ ලොට් 5සී වශයෙන් ලකුණු කොට ඇති පාර (අඩි 12 පළල පාර) සඳහා වෙන් කිරීම, නැගෙනහිරට : නැකත්රාල යන අයගේ ඉඩම, දකුණට : පබ්ලිස් පෙරේරා යන අයගේ ඉඩම සහ බස්නාහිරට : අංක 1482 දරන පිඹුරේ ලොට් 5ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විස්සක් (අ. 0, රූ. 1, පර්. 20) හෝ හෙක්ටයාර් 0.1518ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයක් ද සමග එක අංකී 53/2002 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ, කුඩාගල්බොඩ කෝරළේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ තිත්තවැල්ල ග්‍රාමයේ පිහිටි "බුළුගහමුලහේන දැන් වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. බී. එම්. වෙබර් යන අය විසින් සාදන ලද 2001 ජූලි මස 07 දින සංශෝධිත 1990 පෙබරවාරි මස 09 දාතම හා අංක 1482 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 5බී වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම පිඹුරේ ලොට් 5සී වශයෙන් ලකුණුකොට ඇති පාර (අඩි 12 පළල පාර) සඳහා වෙන් කිරීම, නැගෙනහිරට : කැකත්රාල යන අයගේ ඉඩම, දකුණට : පබ්ලිස් පෙරේරා යන අයගේ ඉඩම සහ බස්නාහිරට : අංක 1482 දරන එම පිඹුරේ ලොට් 5ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විස්සක් (අ. 0, රූ. 1, පර්. 20) හෝ හෙක්ටයාර් 0.1518ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයක් ද සමග එකී අංක 1482 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඒ1171/276 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 53/2002 දරන පිඹුරේ ලොට් 5සී සහ අංක 1482 දරන පිඹුරේ ලොට් 6 වශයෙන් ලකුණුකොට ඇති මාර්ග වෙන් කිරීම දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-367/11

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ද සැබ්.
ගිණුම් අංක : 0013 1000 8474/0013 1000 7427.

සීමාසහිත සම්පත් බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ ජූනි මස 24 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පී. කිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. දසනායක යන අය විසින් ලියා සහතික කරන ලද 1990 මාර්තු මස 02 දාතම හා අංක

697 දරන, 1991 මාර්තු මස 28 දාතම හා අංක 841 උකස් බැඳුම්කර දෙක, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. යාපා යන අය විසින් ලියා සහතික කරන ලද 1993 මාර්තු මස 11 දාතම හා අංක 965 දරන, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර යන අය විසින් ලියා සහතික කරන ලද 2000 මාර්තු 24 දාතම හා අංක 1035 දරන, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2004 ඔක්තෝබර් මස 21 දාතම හා අංක 201 දරන, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2005 සැප්තැම්බර් මස 16 දාතම හා අංක 2366 දරන හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2006 ජුනි මස 02 දාතම හා අංක 1107 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට එහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ද සැබ් යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන ඇල්විටිගලගේ දෝන සෝමලතා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අනූ දෙලක්ෂ දහඅට දහස් දොළහයි ශත විසිපහක (රු. 92,18,012.25) මුදලක් 2010 මැයි 05 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් අනූ දෙලක්ෂ දහඅට දහස් දොළහයි ශත විසිපහක (රු. 92,18,012.25) මුදල ද 2010 මැයි 06 වැනි දින සිට අංක 697, 841, 965, 1035, 201, 2366 සහ 1107 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් හයලක්ෂ අසූ දෙදහස් හයසිය එකයි ශත හයක (රු. 6,82,601.06) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිදෙකක් (22%), රුපියල් අටලක්ෂ දහදහස් නවසිය අනූ නමයයි ශත අනූවක (රු. 8,10,999.90) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි දෙකක් (22%), රුපියල් හතලිස් නමලක්ෂ අසූ එක් දහස් පන්සියයක (රු. 49,81,500) මුදලක් සඳහා වාර්ෂිකව සියයට නමයක් (9%)හා තවත් රුපියල් දහනම ලක්ෂ පනස්දහස් පන්සිය හතලිස් දෙකයි ශත හතලිස් එකක (රු. 19,50,542.41) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි නමයක් (29%) බැගින් පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 697, 841, 965, 1035, 201, 2366 සහ 1107 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම උප සුළු නගර සභා සීමාවන් තුළ පන්නිපිටිය හා ගොඩිගමුව ග්‍රාමයන් හි පිහිටි වරිපනම් අංක 126 දරන "තහනන්කැලේ *නොහොත් හයිගිය එස්ටේට් නොහොත් මහමේග එස්ටේට්*" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. කේ. එම්. ද සිල්වා යන අය විසින් සාදන ලද 1968 ජනවාරි 21 දාතම හා අංක 65 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණයකොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කෙටසට මායිම්, උතුරට : හයිලෙවල් පාර, නැගෙනහිරට : චාර්ලිස් එඩ්මන්ඩ් යන අයගේ උරුමක්කාරයින්ට අයිති ඉඩම, දකුණට : එම ඉඩමේ ලොට් 3 සහ බස්නාහිරට : ලොට් 1 (පාර සඳහා වෙන් කිරීම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 15.20) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 65 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව M2800/213 යටතේ දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ, ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

එකී අංක 65 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 1 (පාර සඳහා වෙන් කිරීම)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-367/5

---

**සීමාසහිත සම්පත් බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

කේ. එම්. ඒ. ජනනන්දන.
ගිණුම් අංක : 1069 5302 1996.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007 පෙබරවාරි 22 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සීමාසහිත සම්පත් බැංකුව නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2005 නොවැම්බර් 22 දාතම හා අංක 1179 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දම්පේ, සවිඳු උයන, අංක 130/12 හි පදිංචි කුරුකුත්තල මැදගෙදර අජිත් ජනනන්දන යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හය ලක්ෂ හැට නම දහස් හත්සිය තිස් තුනයි ශත විසි තුනක (රු. 6,69,733.23) මුදලක් 2006 දෙසැම්බර් 27 වැනි දිනට එකී සීමාසහිත සම්පත් බැංකුව වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හය ලක්ෂ හැට නම දහස් හත්සිය තිස් තුනයි ශත විසි තුනක (රු. 6,69,733.23) මුදල ද 2006 දෙසැම්බර් 28 දින සිට අංක 1179 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හය ලක්ෂ දහසය දහස් දෙසිය අසූ අටයි ශත විසි තුනක (රු. 6,16,288.23) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1179 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සීමාසහිත සම්පත් බැංකුව වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති

බලතල ප්‍රකාර එකී සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ මැද පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දම්පේ පිහිටි දඹුගොල්ල එස්ටේට් යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩී. ජී. වීරසිංහ යන අය විසින් සාදන ලද 1997 දෙසැම්බර් 02 දාතම හා අංක 1339 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 26 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 25, නැගෙනහිරට : ලොට් 52, දකුණට : ලොට් 27 සහ බස්නාහිරට : ලොට් 47 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම බිංදුවයි අටක් (අ. 0, රූ. 0, පර්. 10.08) විශාල ඉඩම් කෙටස සමග පස, ගහකොළ වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1339 දරන පිඹුරට අනුව වෙළුම/පත් ඉරුව එන් 317/79 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ, ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

එකී අංක 1339 දරන පිඹුරේ නිරූපිත ලොට් 47 සහ 44

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

08-367/9

---

LE/RE/201.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 18/0/87/00078.
ණයකරුගේ සම්පූර්ණ නම : අබ්දුල් කෆාර් මොහොමඩ් මුනව්ෆර් හෙවත් අබ්දුල් කපාර් මොහොමඩ් මුනව්පර් සහ මොහොමඩ් කාසීම් පාතිමා ජමීලා

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. හේවාපතිරණ විසින් ලියා සහතික කරන ලද 6870 හා 2008.02.27 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත) 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ හැත්තෑ එක්දහස් හැට පහයි ශත පනස් නවයක (රු. 5,71,065.59) මුදලක් වර්ෂ 2009.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(01) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හාරලක්ෂ අනූඅට දහස් හයසිය හැත්තෑ හතරයි ශත පනස් දෙකක (රු. 4,98,674.52) මුදල ද 2009.07.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් හැත්තෑ දෙදහස් තුන්සිය අනූ එකයි ශත හතක් (රු. 72,391.07) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පන්ලක්ෂ හැත්තෑ එක්දහස් හැට පහයි ශත පනස් නවයක (රු. 5,71,065.59) ද,

(02) එකී රුපියල් හාරලක්ෂ අනූඅට දහස් හයසිය හැත්තෑ හතරයි ශත පනස් දෙකක (රු. 4,98,674.52) මුදල මත අයවිය යුතු වර්ෂයකට 27.00% බැගින් වූ අමතර පොලිය 2009.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(03) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකල හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009ක් වූ අගෝස්තු මස 28 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, උඩපොල ඕතොට කෝරළේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ, ගල්බඩගම පිහිටි කෙතේවත්ත නමැති ඉඩමට ආර්. එන්. කරුණාතිලක බලයලත් මානක විසින් 2007.06.18 දින මැන සම්පාදිත අංක 2099 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1 දරන ඉඩමට මායිම්, උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : ඉහත කී පිඹුර ප්‍රකාර කැබලි අංක 2 ද, දකුණට : එඩ්වින් හිමිකම් කියන ඉඩම වෙන් කරන පැළ ඉණි වැට සහ කම්බි වැට ද, බටහිරට : නලින් හිමිකම් කියන ඉඩම වෙන් කරන පැළ ඉණි වැට සහ කම්බිවැට ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක (අක්. 0, රූ. 0, පර්. 20) වපසරියකින් යුතු මෙම ඉඩම, හා ඊට අයත් සියළු දේ ද සමග වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 1278/295 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

08-356

---

ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990

අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩලය යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් එච්.එම්.සී.සී.එච්. මැණිකේ විසින් ලියා සහතික කරන ලද අංක 2652 හා 2008 අගෝස්තු 11 වැනි දින දරන උකස් බැඳුම්කරය මත, අයවිය යුතු මුදල් ගෙවීම, "තරංගනී හාඩ්වෙයාර්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස මොණරාගල ව්‍යාපාරය කරගෙන යන, විජේසිංහ දයාවතී සහ රත්නායක මුදියන්සේලාගේ දිලංක වජිර බණ්ඩාර යන අය විසින් පැහැර ඇති හෙයින් ද, 2010 ජනවාරි 31 වැනි දිනට ඉහත කී අංක 2652 දරන උකස් බැඳුම්කරය මත, එකී විජේසිංහ දයාවතී සහ රත්නායක මුදියන්සේලාගේ දිලංක වජිර බණ්ඩාර යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට, රුපියල් දහහතර ලක්ෂ අසූහතර දහස් නවසිය අනූනවයකුත් ශත හැට එකක (රු.14,84,999.61) මුදලක් සහ 2010 පෙබරවාරි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එයින් රුපියල් එකොලොස් ලක්ෂ අනූපන් දහස් අටසිය තිස්එකක් (රු.11,95,831.00) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම් :

(අ) බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී.ආර්) ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය : හෝ

(ආ) රඳවාගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයට සියයට නවයක් (9%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද (මෙම පොළී අනුපාතික එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලැබේ)

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් දහහතර ලක්ෂ අසූහතර දහස් නවසිය අනූනවයකුත් ශත හැට එකක (රු.14,84,999.61) මුදල සහ 2010 පෙබරවාරි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එයින් රුපියල් එකොලොස් ලක්ෂ අනූපන් දහස් අටසිය තිස්එකක් (රු.11,95,831.00) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම් :

(අ) බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය : හෝ

(ආ) රඳවාගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයට සියයට නවයක (9%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද (මෙම පොළී අනුපාතික එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලැබේ) හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2652 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 2652 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹගල්ල කෝරළේ, තෙරෙල ග්‍රාමයේ පිහිටි, "උඩුදැවිලව" යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් සකස් කරන ලද අංක 845 හා 1995.09.29 දින දරන පිඹුරේ ලොට් අංක $855^5$ ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : FVP596 දරන පිඹුරේ ලොට් අංක 728 ද, නැගෙනහිරට: ලොට් අංක $855^6$ ද, දකුණට : ඇල දිගට ඇති රිසවේසම (FVP596 හි ලොට් 856) ද බස්නාහිරට : ලොට් අංක 855 ද යන මායිම් ඇතුළත රූඩ් තුනකුත් පර්චස් තිස් දෙකක් (අ. 0, රූ. 3, ප. 32) නොහොත් හෙක්ටෙයාර බිංදුවයි දශම තුනයි අටයි හතරක් (හෙ. 0.384) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් මෑතක දී කරන ලද මැනීමකට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹගල්ල කෝරළේ, තෙරෙල ග්‍රාමයේ පිහිටි, "උඩුදැවිලව" යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ, බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් මැන සකස් කළ අංක 4063 හා 2002 ඔක්තෝබර් 09 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක $855^5$ ලෙස දැක්වෙන (ඉහත සඳහන් අංක 845 දරන පිඹුරේ ලොට් අංක $855^5$ දරන ඉඩම නැවත මැනීමක් වූ) බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ප්‍රවේශ මාර්ගය (ලොට් $855^7$) ද, නැගෙනහිරට : ලොට් අංක $855^6$ ද දකුණට ඇල දිගට ඇති රිසවේසම (FVP 596 හි ලොට් 856) ද, බස්නාහිරට : ලොට් අංක $855^4$ ද යන මායිම් ඇතුළත රූඩ් තුනකුත්, පර්චස් තිස් දෙකක් (අ. 0, රූ. 3, පර්. 32) නොහොත් හෙක්ටෙයාර බිංදුවයි දශම තුනයි අටයි හතරක් (හෙ 0.384) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලුපාර,
කොළඹ 03.

08- 332/1

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම.

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990

අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට බදුල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් එච්.එම්.සී.සී.එච්. මැණිකේ විසින් ලියා සහතික කරන ලද අංක 2051 හා 2007 ජුනි 07 දින දරන මුල් උකස් බැඳුම්කරය මත, අයිවිය යුතු මුදල් ගෙවීම්, මීරහගහවත්තේ පෙරමුණගෙ ආරච්චිරාලලාගේ කාන්ති මල්ලිකා නිලවීර නොහොත් පෙරමුණගෙ ආරච්චිලගේ කාන්ති මල්ලිකා නිලවීර යන අය විසින් පැහැර ඇති හෙයින් ද, 2010 ජනවාරි 31 වැනි දිනට ඉහත කී අංක 2051 දරන උකස් බැඳුම්කරය මත, එකී පෙරමුණගෙ ආරච්චිරාලලාගේ කාන්ති මල්ලිකා නිලවීර නොහොත් පෙරමුණගෙ ආරච්චිලගේ කාන්ති මල්ලිකා නිලවීර යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට, රුපියල් දහතුන් ලක්ෂ දහතුන් දහස් පන්සිය හැට අටකුත් ශත හැත්තෑපහක් (රු.13,13,568.75) මුදලක් සහ 2010 පෙබරවාරි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එයින් රුපියල් එකොලොස් ලක්ෂ හැත්තෑහත් දහස් තුන්සිය හැට පහකුත් ශත එකොළහක් (රු.11,77,365.11) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරනු ලබන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද ;

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් දහතුන් ලක්ෂ දහතුන් දහස් පන්සිය හැට අටකුත් ශත හැත්තෑපහක් (රු.13,13,568.75) මුදල සහ 2010 පෙබරවාරි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එයින් රුපියල් එකොලොස් ලක්ෂ හැත්තෑහත් දහස් තුන්සිය හැට පහකුත් ශත එකොළහක් (රු.11,77,365.11) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරනු ලබන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2051 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. ජයතිලක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 2051 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹවිනි පළාත කෝරළේ, මීරහවත්ත වැලිකඩගම පිහිටි "මීරහවත්ත එස්ටේට්" යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ (බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. නන්දසේන විසින් මැන සකස් කළ අංක 1649 හා 1998 ඔක්තෝබර් 04 දින දරන පිඹුරේ ලොට් අංක 1 දරන ඉඩම නැවත මැන අනුබෙදීමක් වන) බලයලත් මිනින්දෝරු විමල් රාජරත්න විසින් මැන සකස් කළ අංක 1531 හා 2006.07.10 දින දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස දැක්වෙන බෙදා වෙන්කළ ඉඩම වන) උතුරට : ලොට් අංක 01 ද, නැගෙනහිරට : ලොට් අංක 03 ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද යන මායිම් ඇතුළත අක්කර හතරකුත් රූඩ් දෙකකුත් පර්චස් තිස් නවයක් (අ. 4, රූ. 2, පර්. 39) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ අඩි 15ක් පළල ප්‍රවේශ මාර්ගය හා එහි පිහිටි සියලු දේ.

ඉහත දැක්වෙන ලොට් අංක 2 දරන ඉඩම මෙහි පහත විස්තර කරන ඉඩමෙන් බෙදා වෙන්කළ කොටසක් වේ.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹවිනි පළාත කෝරළේ, මීරහවත්ත, වැලිකඩගම පිහිටි "මීරහවත්ත එස්ටේට්" යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. නන්දසේන විසින් මැන සකස් කළ අංක 1649 හා 1998 ඔක්තෝබර් 04 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන බෙදා වෙන් කළ ඉඩම වන, උතුරට, නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස මායිම් වන අක්කර හයකුත් රූඩ් තුනකුත් පර්චස් දොළහක් (අ. 6, රූ. 3, පර්. 12)බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ අඩි 15ක් පළල ප්‍රවේශ මාර්ගය හා එම ඉඩමේ පිහිටි සියලු දේ. මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලුපාර,
කොළඹ 03.

08- 332/2

---

**සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. එන්. සී. ජයකොඩි විසින් ලියා සහතික කරන ලද අංක 443 හා 2007.07.13 දින දරන මුල් උකස් බැඳුම්කරය සහ අංක 517 හා 2008.02.29 දින දරන ද්විතීයික උකස් බැඳුම්කරය මත, අයිවිය යුතු මුදල් ගෙවීම, උඩුබද්දාවෙහි පදිංචි කවිකාර බන්ජතයලාගේ අනුර දුශ්‍යාන්ත නොහොත් කවිකාර බන්ජනයලාගේ අනුර දුශ්‍යාන්ත නොහොත්

කවිකාර බන්ජකයලාගේ අනුර දුශ්‍යාන්ත යන අය විසින් පැහැර ඇති හෙයින් ද, 2009 දෙසැම්බර් 31 වැනි දිනට ඉහත කී අංක 443 හා 517 දරන උකස් බැඳුම්කරය මත, එකී කවිකාර බන්ජනයලාගේ අනුර දුශ්‍යාන්ත නොහොත් කවිකාර බන්ජනයලාගේ අනුර දුශ්‍යාන්ත නොහොත් කවිකාර බන්ජකයලාගේ අනුර දුශ්‍යාන්ත යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට, රුපියල් අටලක්ෂ එක්දහස් නවසිය පනස් එකකුත් ශත විසි දෙකක (රු.8,01,951.22) මුදලක් සහ 2010 ජනවාරි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එයින් රුපියල් පන්ලක්ෂ අනූහත්දහස් හත්සිය විසිහතරකුත් ශත පනස් දෙකක් (රු.5,97,724.52) සඳහා වර්ෂයකට සියයට විසිදෙක (22%) බැගින් ගණන් බලන ලද පොලිය සහ රුපියල් එක් ලක්ෂ අසූදහස් පන්සිය පනස් තුනක් (රු.1,80,553.00) සඳහා වර්ෂයකට සියයට විසිහයකුත් දශම පහ (26.5%) බැගින් ගණන් බලන ලද පොලිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද ;

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් අටලක්ෂ එක්දහස් නවසිය පනස් එකකුත් ශත විසි දෙකක (රු.8,01,951.22) මුදල සහ 2010 ජනවාරි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එයින් රුපියල් පන්ලක්ෂ අනූහත්දහස් හත්සිය විසිහතරකුත් ශත පනස් දෙකක් (රු.5,97,724.52) සඳහා වර්ෂයකට සියයට විසිදෙක (22%) බැගින් ගණන් බලන ලද පොලිය සහ රුපියල් එක් ලක්ෂ අසූදහස් පන්සිය පනස් තුනක් (රු.1,80,553.00) සඳහා වර්ෂයකට සියයට විසිහයකුත් දශම පහ (26.5%) බැගින් ගණන් බලන ලද පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 443 හා 517 දරන උකස් බැඳුම්කර මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර එල්.බී.සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 443 සහ 517 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ආනවිලුන්දාන් පත්තුවේ, උතුරු පිටිගල් කෝරළේ, බංගදෙණිය ග්‍රාම නිලධාරී වසමේ, බංගදෙණිය පහලකටුව ග්‍රාමයේ පිහිටි, පහලකටුව නමැති රජයේ බිම් කට්ටියක් වන, උතුරට : නිල්මිණී හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : නයෝමි අප්සරා හිමිකම් කියන ඉඩම ද, දකුණට : ලියෝ ක්‍රිස්ටි නිමල් හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : පාර ද යන මායිම් ඇතුළත පර්චස් තිස් පහක් (අ. 0, රූ. 0, පර්. 35) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ. මෙම ඉඩම හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මැතක දී කරන ලද මැනීමකට අනුව ඉහත දැක්වෙන ඉඩම පහත සඳහන් පරිදි විස්තර කර තිබේ.

වයඹ පළාතේ, පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ආනවිලුන්දාන් පත්තුවේ, උතුරු පිටිගල් කෝරළේ, බංගදෙණිය, ග්‍රාම නිලධාරී වසමේ, බංගදෙණිය පහලකටුව ග්‍රාමයේ පිහිටි, පහලකටුව යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ, බලයලත් මිනින්දෝරු එම්. ගුණසේකර විසින් මැන සකස් කළ අංක 3109 හා 2000 මැයි 27 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට අංක 3109 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : නිල්මිණී හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : තුෂාර ඉන්දික හිමිකම් කියන ඉඩම ද, දකුණට : ලියෝ ප්‍රානාන්දු හිමිකම් කියන ඉඩම ද බස්නාහිරට : පාර ද යන මායිම් ඇතුළත පර්චස් තිස්පහක් (අ. 0, රූ. 0, පර්. 35) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ හා ඊට අනුබද්ධ සියලු දේ.

ලක්ෂ්මන් සිල්වා,
කළමණාකාර අධ්‍යක්ෂ.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

08- 331

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 116 දරන) කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය

ණය ගිණුම් අංක : 408458, 432819

මාවතගේ ප්‍රසාද් සේනක සෙනවිරත්න හෙවත් මහවත්තගේ ප්‍රසාද් සේනක සෙනවිරත්න ක්‍රිස්ටල් එක්ස්පෝර්ට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. ඩී. රණගල විසින් කලින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් සහ වර්තමානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 740 සහ 2007 නොවැම්බර් මස 22 වැනි දින දරන බැඳුම්කරය මත ගෙවීම් එහි බන්ධනදායී වන ඉහත කී මාවතගේ ප්‍රසාද් සේනක සෙනවිරත්න හෙවත් මහවත්තගේ ප්‍රසාද් සේනක සෙනවිරත්න යන අය විසින් පැහැර හැරීම මත කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත වර්තමානයේ දී ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද, තවද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. ඩී. රණගල විසින් කලින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් සහ වර්තමානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 741 සහ 2007 නොවැම්බර් මස 22 වැනි දින දරන බැඳුම්කරය මත ගෙවීම් එහි බන්ධනදායී වන ඉහත කී ක්‍රිස්ටල් එක්ස්පෝර්ට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ එහි උකස්කරු වන මාවතගේ ප්‍රසාද් සේනක සෙනවිරත්න හෙවත් මහවත්තගේ ප්‍රසාද් සේනක සෙනවිරත්න යන අය විසින් පැහැර හැරීම මත කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත වර්තමානයේ ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද, ඉහත කී බැඳුම්කරය මත 2009 ජූලි මස 28 වැනි දින රුපියල් හැටහත්ලක්ෂ විසිදහස් හැටනවයකුත් ශත තිස්තුනක (රු. 67,20,069.33) මුදලක් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත වර්තමානයේ දී ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද, ඉහත කී රුපියල් හැටහත්ලක්ෂ

විසිදහස් හැටනවයකුත් ශත තිස්තුනක (රු. 67,20,069.33) මුදල සහ 2009 ජූලි මස 29 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් තිස්දෙලක්ෂ පනස්පන්දහස් හාරසිය හැටතුනකුත් ශත දහතුනක (රු. 32,55,463.13) මුදල මත වර්ෂයකට 24% බැගින් සහ රුපියල් විසිහයලක්ෂ විසිහතරදහස් තුන්සීයයක (රු. 26,24,300) මුදල මත වර්ෂයකට 27% බැගින් පොලිය ද, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා ඉහත කී අංක 740 සහ 741 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, අළුත් කඩේ වීදියේ, අංක 99 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු වන එල්.බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ රාගම පිහිටි මාරාගහවත්ත සහ මීගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 2816 සහ 1974 මාර්තු මස 04 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ඉඩම් කැබැල්ලට මායිම් උතුරට : එල්. ඩී. සිල්වාගේ උරුමක්කාරයන්ට අයිති එම ඉඩමේම ඉතිරි කොටස ද, නැගෙනහිරට : මහා මාර්ගය ද, දකුණට : අඩි 10 ක් පළල පාර සඳහා වෙන් කළ කොටස ද, බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2816 දරන පිඹුර අනුව පර්චස් 20 ක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පලතුරු ආදී සෑම සියලු දේත් සමගය. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B588/21 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම මෑත කාලීන මැනීමට අනුව පහත පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ රාගම පිහිටි මාරාගහවත්ත සහ මීගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. බී. එල්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 4277A හා 2003 ජූලි මස 11 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් A (බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 2816 සහ 1974 මාර්තු මස 04 වැනි දින දරන පිඹුරේ නිරූපිත ඉඩමට නැවත මැන බෙදීමක් වශයෙන් බලයලත් මිනින්දෝරු පී.එච්.ඊ. මෙන්ඩිස් විසින් මැන සාදන ලද අංක 6588 සහ 1991 පෙබරවාරි මස 2 වැනි දින දරන පිඹුරේ නිරූපිත ඉඩමේ නැවත මැන බෙදීමක් වන) නමැති බිම් කොටසට මායිම්, උතුරට : පාර ද නැගෙනහිරට : තේවත්ත පාර ද, දකුණට : පාර (අංක 2277 දරන පිඹුරේ ලොට් B1) ද, බස්නාහිරට : ඩී. ඩී. නානායක්කාරගේ (වඩාත් නිවැරදිව ඩී. බී. නානායක්කාර) ඉඩම ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 4277A දරන පිඹුර අනුව පර්චස් දහඅටයි දශම අටයි පහක් (අ. 0, රූ. 0, පර්. 18.85) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලුදේත් සමගය.

ආර්. ආර්. දුනුවිල,
සමාගම් ලේකම්.

08-290

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංකය : 1690002730.

සේනාධීර අප්පුහාමිලාගේ දොන් චන්ද්‍රගුප්ත සේනාධීර, සේනාධීර අප්පුහාමිලාගේ දොන් එඩ්වඩ් ගාමිණී සේනාධීර සහ සේනාධීර අප්පුහාමිලාගේ දොන් දාතිය සේනාධීර.

2010 මැයි මස 26 වැනි දින පවත්වන ලද රැස්වීකමදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. සී. පී. ගනේපොල විසින් 2006 ජූලි මස 28 වැනි දින සහතික කරන ලද අංක 11606 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සේනාධීර අප්පුහාමිලාගේ දොන් චන්ද්‍රගුප්ත සේනාධීර, සේනාධීර අප්පුහාමිලාගේ දොන් එඩ්වඩ් ගාමිණී සේනාධීර සහ සේනාධීර අප්පුහාමිලාගේ දොන් දාතිය සේනාධීර ණයකරුවන් හැටියට ද උකස්කරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් නවලක්ෂ අනූදහස් තුන්සිය එකොළහයි ශත හැට අටක (රු.9,90,311.68) මුදලක් 2009 සැප්තැම්බර් මස 25 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් නවලක්ෂ අනූදහස් තුන්සිය එකොළහයි ශත හැට අටක (රු. 9,90,311.68) මුදල අය කර ගැනීම සඳහා 2010 සැප්තැම්බර් මස 26 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 9,90,311.68 ක මුදල මත 22% ක වැඩි දුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබා ගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 11606 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12 හල්ෆ්ස්ඩෝප් වීදියේ අංක 99 හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලැබේ.

### උපලේඛනය

1. අනුග්‍රහලත් මිනින්දෝරු ඩබ්. ඒ. ආර්. එස්. පෙරේරා විසින් 2002 මැයි 12 වැනි දින සාදන ලද පිඹුරු අංක 1177 දරන පිඹුරෙහි දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා (දැන් නගර සභා සීමාවන්) සීමාවන් තුළ තුම්බෝවිල පිහිටි බටුවිටියවත්ත කියන ඉඩමේ ගොඩනැගිලි, වෘක්ෂයන්, වගාවන් සහ එහි පවත්නා අනෙකුත් සියලුදේත් සමග බෙදා වෙන්කර ලොට් 1 ලෙස සළකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : මොරකැටි පාර සහ පිඹුරු අංක 319 හි ලොට් 1 ද, නැගෙනහිරට : පිඹුරු අංක 319 හි ලොට් 1 සහ ලොට් 2 ද, දකුණට : ලොට් 2 සහ පාර (අඩි 16 ක් පළල) ද සහ බස්නාහිරට : පාර (අඩි 16 ක් පළල) සහ මොරකැටිය පාර ද යන මායිම් තුළ එකී පිඹුරු අංක 1177 ට අනුව පර්චස් දහඅටයි දශම

හයයි තුනක් (අ. 0, රූ. 0, පර්. 18.63) විශාල ඉඩම නුගේගොඩ - දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ m2992/124 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

2. අනුග්‍රහලත් මිනින්දෝරු ඩබ්. ඒ. ආර්. එස්. පෙරේරා විසින් 2002 මැයි මස 12 වැනි දින සාදන ලද පිඹුරු අංක 1177 හි දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා (දැන් මහ නගර සභා සීමාවන්) සීමාවන් තුළ තුම්බෝවිල පිහිටි බටුවිටියවත්ත කියන ඉඩමේ ගොඩනැගිලි, වෘක්ෂයන්, වගාවන් සහ එහි පවත්නා අනෙකුත් සියලුදේත් සමග බෙදා වෙන් කරන ලොට් 2 ලෙස සළකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට ෘ ලොට් 1 සහ පිඹුරු අංක 319 හි ලොට් 1 ද, නැගෙනහිරට ෘ පිඹුරු අංක 319 හි ලොට් 1 සහ ලොට් 3 ද, දකුණට ෘ ලොට් 3 සහ පාර (අඩි 16 ක් පළල) ද බස්නාහිරට ෘ පාර (අඩි 16 ක් පළල) සහ ලොට් 1 ද යන මායිම් තුළ එකී පිඹුරු අංක 1177 ට අනුව පර්චස් දහයයි දශම පහයි දෙකක් (අ. 0, රූ. 0. පර්. 10.52) විශාල ඉඩම නුගේගොඩ - දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ m2992/125 වෙළුමේ/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

08-289

---

## ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා බැංකුව

1990 අංක 4 දරන බැංකු ණය ආපසු අයකරගැනීමේ (විශේෂ විධි විධාන) පනත යටතේ ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා බැංකුවේ ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක කමිටුවේ යෝජනා සම්මතය

ගිණුම් අංක. 1. 25160061450219
2. 25160061450220
3. 25160061460219

වත්තල, ඇවරිවත්ත පාරේ, නිකලස් මාවතේ, අංක 52/25 ස්ථානයේ (පෙර - කොළඹ 13, ජෝර්ජ් ආර් ඩි සිල්වා මාවත අංක 307) ලියාපදිංචි කාර්යාලය ඇති මෙට්ල් පැක් ඇන්ඩ් ප්‍රින්ටින් ඉන්ඩස්ට්‍රීස් (පෞද්ගලික) සමාගම.

2007, සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී විශේෂිතව හා ඒකමතිකව පහත දැක්වෙන යෝජනාව සම්මත කරගන්නා ලදී ෘ-

ශ්‍රී ලංකාව තුළ වත්තල, ඇවරිවත්ත පාරේ, නිකලස් මාවතේ, අංක 52/25 ස්ථානයේ (පෙර - කොළඹ 13, ජෝර්ජ් ආර් ඩි සිල්වා මාවත අංක 307) ලියාපදිංචි කාර්යාලය ඇති, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලෙස විධිමත් පරිදි ශ්‍රී ලංකා සමාජවාදී ජනරජය තුළ ලියාපදිංචි මෙට්ල් පැක් ඇන්ඩ් ප්‍රින්ටින් ඉන්ඩස්ට්‍රීස් (පෞද්ගලික) සමාගම (අත්තිකාරම් හා ණය ලෙස) මුදල් ආධාර හා මූල්‍ය පහසුකම්, ඉන්දියාවේ මුම්බායි වල, මැඩම් කැමා පාරේ ප්‍රධාන කාර්යාලය ඇති, 1955 ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා පනත යටතේ විධිමත් ලෙස ලියාපදිංචි කළ බැංකු සංස්ථාවක් වූ හා ශ්‍රී ලංකාවේ බලපත්‍රලත් වානිජ බැංකුවක් ලෙස ද ලියාපදිංචි වී ශ්‍රී ලංකාවේ, කොළඹ 01, සර් බාරොන් ජයතිලක මාවතේ, අංක 16 යන ස්ථානයේ ලියාපදිංචි ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා බැංකුවෙන් ලබාගෙන ඇති අතර.

එසේ ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා බැංකුවෙන් ලබාගන්නා ලද මුදල් හා ඒ වෙනුවෙන් ගෙවිය යුතු පොලී මුදල් වෙනුවෙන් සුරැකුමක් ලෙස ණය බැඳුම්කරු වශයෙන් මෙට්ල් පැක් ඇන්ඩ් ප්‍රින්ටින් ඉන්ඩස්ට්‍රීස් (පෞද්ගලික) සමාගම පහත දැක්වෙන බැඳුම්කර ලියා අත්සන් කොට ඇත ෘ-

(අ) මෙහි දක්වා ඇති පලමුවැනි උපලේඛනයේ පලමුවැනි කොටසේ සහ දෙවන කොටසේ හා අංක 1022 දරන ප්‍රාථමික උකස්කර බැඳුම්කරයේ උපලේඛනයේ පළමුවන හා දෙවන කොටස්වල වඩාත් සවිස්තරව දක්වා ඇති දේපල, ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා බැංකුව නමට ප්‍රාථමික උකසක් ඇතිකරමින්, ඒ.සී. ආර්. ඩී. ප්‍රනාන්දු, ප්‍රසිද්ධ නොතාරිස්තැන විසින් 2006 පෙබරවාරි මස 15 වැනි දින ලියන ලද අංක 1022 ප්‍රාථමික උකස් බැඳුම්කරය

(ආ) මෙහි දක්වා ඇති දෙවැනි උපලේඛනයේ හා අංක 1023 උකස් බැඳුම්කරයේ දෙවැනි උපලේඛනයේ වඩාත් සවිස්තරව දක්වා ඇති දේපලේ බැඳුම්කර අයිතිය හා හිමිකම සහ ස්ථිර ලෙස පොලොවට සවිකල යන්ත්‍ර හා එම යන්ත්‍රවල කොටස් හා එම යන්ත්‍රවලට ස්ථිර ලෙස සවිකළ (මෙහි තුන්වැනි උපලේඛනයේ හා අංක 1023 ප්‍රාථමික උකස් බැඳුම්කරයේ තුන්වැනි උපලේඛනයේ කෙටියෙන් විස්තර දක්වා ඇති) යන්ත්‍ර හා උපකරණ යන දේපල හා ස්ථානීය බැඳියාව හා අයිතිය ප්‍රාථමික උකසක් මගින් ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා බැංකුව නමට පවරමින් ඒ.සී.ආර්.ඩී. ප්‍රනාන්දු, ප්‍රසිද්ධ නොතාරිස්තැන විසින් 2006 පෙබරවාරි මස 15 වැනි දින ලියන ලද අංක 1023 ප්‍රාථමික උකස් බැඳුම්කරය.

(ඇ) මෙහි දෙවැනි උපලේඛනයේ හා අංක 1025 දරන ද්විතික උකස් බැඳුම්කරයේ පලමුවැනි උපලේඛනයේ වඩාත් සවිස්තර දක්වා ඇති දේපලේ හෝ දේපල වෙනුවෙන් වූ බැඳුම්කර අයිතිය හා හිමිකම සහ ස්ථිර ලෙස පොලොවට සවිකළ යන්ත්‍ර හා එම යන්ත්‍රවල කොටස් හා එම යන්ත්‍රවලට ස්ථිර ලෙස සවිකල (මෙහි තුන්වැනි උපලේඛනයේ හා අංක 1025 ද්විතීක උකස් බැඳුම්කරයේ දෙවැනි උපලේඛනයේ කෙටියෙන් විස්තර දක්වා ඇති) උපකරණ, දේපළ හා ස්ථානීය බැඳියාව හා අයිතිය ද්විතීය උකස්කරයක් මගින් ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා බැංකුව නමට පවරමින් ඒ. සී. ආර්. ඩී. ප්‍රනාන්දු, ප්‍රසිද්ධ නොතාරිස්තැන විසින් 2006 පෙබරවාරි මස 15 වැනි දින ලියන ලද අංක 1025 දරන ද්විතීක උකස් බැඳුම්කරය

එසේම, ඉහත ප්‍රකාර මූල්‍ය පහසුකම් සැපයීම වෙනුවෙන් මෙට්ල් පැක් ඇන්ඩ් ප්‍රින්ටින් ඉන්ඩස්ට්‍රීස් (පෞද්ගලික) සමාගම විසින් ඉහත සඳහන් කළ අංක 1022, 1023 හා 1025 දරන උකස් බැඳුම්කරවල වගන්ති අනුව හා ප්‍රකාරව ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා බැංකුවට, 2007.08.10 වැනි දිනට ගෙවීමට ඇති හා නොගෙවා ඇති මුදල රුපියල් මිලියන අනූ අටක් හා අනූ ලක්ෂ දෙදහස් හයසිය හතලිස් නමයයි ශත පනස් හතරක් (රු.98,902,649.54) පමණක් වන අතර ඊට වර්ෂයකට 17% බැගින් 2007.01.01 වැනි දින සිට ඉහත කී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වනතුරු පොලිය ද ගෙවීමට ඇත.

එසේම මෙට්ල් පැක් ඇන්ඩ් ප්‍රින්ටින් ඉන්ඩස්ට්‍රීස් (පෞද්ගලික) සමාගම විසින් ඉහත සඳහන් මූල්‍ය පහසුකම් වෙනුවෙන් ඉහත සඳහන් කළ අංක 1022, 1023 හා 1025 දරන උකස් බැඳුම්කරවල වගන්ති ප්‍රකාරව ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා බැංකුවට ගෙවීමට ඇති ඉහත මුදල ගෙවීම මේ දක්වා පැහැර හැර ඇත.

එබැවින්, ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා බැංකුවේ ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක කමිටුවවන අපි, 1990 අංක 4 දරන බැංකු ණය අයකරගැනීමේ (විශේෂ විධි විධාන) පනත යටතේ අප වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉහත සඳහන් මූල්‍ය පහසුකම් වෙනුවෙන් ගෙවිය යුතු හා දැනට ගෙවීම පැහැර හැර ඇති මුදලට ඇප බැඳුම්කර වශයෙන් ඉහත

සඳහන් කළ අංක 1022, 1023 හා 1025 දරන උකස් බැඳුම්කරවලින් ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා බැංකුව වෙත උකස් කර ඇති (මෙහි ඇති උපලේඛන වල හා අංක 1022, 1023 හා 1025 දරන උකස් බැඳුම්කරවල උපලේඛනවල වඩාත් විස්තරාත්මකව දක්වා ඇති) දේපල, බලයලත් වෙන්දේසිකරුවෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා අප බැංකුවට අය වීමට ඇති රුපියල් මිලියන අනූ අටක් හා අනූ ලක්ෂ දෙදහස් හයසිය හතලිස් නමයයි ශත පනස් හතරක් (රු.98,902,649.54) මුදල ද, වර්ෂයකට 17% බැගින් 2007.01.01 වැනි දින සිට ඉහත කී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වනතුරු පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ඉහත දේපල විකිණීම සඳහා ගෙවූ වෙනත් ගාස්තු හා වියදම් ද මේ දක්වා කරන ලද යම් ගෙවීමක් (ඇත්නම්) එය අඩුකොට සම්පූර්ණයෙන් අය කර ගැනීමට අපි තීරණය කරමු.

### පලමුවැනි උපලේඛනය

*පලමුවැනි කොටස :*

ජනරජයේ, බස්නාහිර පළාතේ, (මීගමුව ඉඩම් ලියා පදිංචි කිරීමේ කලාපය තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක - සීදුව නගර සභා සීමාව තුළ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, ලියනගේමුල්ල ග්‍රාමයේ, ඩී.පී. විමලසේන, බලයලත් මිනින්දෝරු විසින් 2005 දෙසම්බර් 29 දාතමින් සකස් කළ පිඹුරු අංක 5639 යේ ලොට් අංක 1 වශයෙන් පෙන්නුම් කරන කඩොල්කැලේවත්ත ලෙස හඳුන්වන ඉඩමේ පිහිටි ඉහත සමාගමේ ගබඩා හා ගොඩනැගිලි තුළ ඇති සම්පූර්ණ අත ඇති තොගය, වෙළඳ භාණ්ඩ, අමු ද්‍රව්‍ය, නිමවෙමින් පවතින හා නිමවූ නිෂ්පාදන භාණ්ඩ, ගබඩා කොට ඇති ආලේපන තීන්ත, තඹ කම්බි, ජී. අයි. කම්බි, ඇලුමිනියම් පත්‍ර, නිශ්චිත මුද්‍රණ ප්‍රතිරූප තහඩු, මුද්‍රණ අංශයේ ඇති විවිධ රසායනික ද්‍රව්‍ය, කාඩ්බෝර්ඩ් පෙට්ටි, ලනු, නූල් කැරලි ඇතුළුව සියලුම ඇසුරුම් ද්‍රව්‍ය හා ගබඩා වල ඇති කුමන අන්දමේ හා කුමන වර්ගයේ සියලුම චංචල දේපල හා සමාගම සතු වෙනත් ස්ථානයක වෙනත් ගබඩාවක දැනට ඇති හා ව්‍යාපාරය කරගෙන යාම සඳහා මතුවට කලින් කලට හෝ කවර කාලයක ස්ථානගත කරන ස්ථානවල හා ගබඩාවල ඇති අත ඇති තොග, වෙළඳ භාණ්ඩ, අමු ද්‍රව්‍යය, නිමවෙමින් පවතින හා නිමවූ නිෂ්පාදන භාණ්ඩ, කුමන අන්දමේ හා කුමන වර්ගයේ සියලුම චංචල දේපළ හා මෙම බැඳුම්කර අදාළ වන තාක් ඉහත සඳහන් ගබඩා වලට හෝ සමාගම සතු වෙනත් ස්ථානයකට හෝ වෙනත් ගබඩාවකට හෝ ව්‍යාපාරය කරගෙන යාම සඳහා මතුවට කලින් කලට හෝ කවර කාලයක ස්ථානගත කරන ස්ථානවලට හා ගබඩාවලට මතුවට ගෙන එන, මතුවට ඇති අත ඇති තොග, වෙළඳ භාණ්ඩ, අමු ද්‍රව්‍ය, නිමවෙමින් පවතින හා නිමවූ නිෂ්පාදන භාණ්ඩ, කුමන අන්දමේ හා කුමන වර්ගයේ සියලුම චංචල දේපල හා ව්‍යාපාරයේ කවර කලෙක කවර ස්ථානයක සිට ගුදම්වලට හා ගුදම්වල සිට කවර ස්ථානයකට ප්‍රවාහණය කරනු ලබන ඉහත කී සියලුම චංචල දේපල හා වෙනත් කවර අන්දමක චංචල දේපල හා නැව්ගතකිරීම සඳහා හෝ ඉහත ගුදම්වල, ස්ථානවල හා වෙනත් ස්ථානයක ගබඩා කර ඇති සියලු චංචල දේපල හා ආනයනය කරනු ලැබ නිදහස්කරගැනීම සඳහා රේගුවේ හා වාජ්පු ගබඩාවල ඇති සියලුම චංචල දේපල.

*දෙවැනි කොටස :*

ලියනගේමුල්ල ග්‍රාමයේ ඉහත සඳහන් කළ අංක 5639 පිඹුරේ ලොට් අංක 1 ලෙස පෙන්නුම් කරන කඩොල්කැලේවත්ත ලෙස හඳුන්වන සමාගම් පරිශ්‍රයේ දැනට ඇති හා තබා ඇති රෝලර් කටින් ආර්ක් වෑල්ඩින් උපකරණය, පරිඝනක, ලිපිගොනු කැබිනෙට්ටු, කාර්යාල උපකරන, සවිකිරීම් හා අනෙකුත් සියලු උපංග, ආයුධ, මෙවලම් හා විදුලි උපකරන ඇතුළුව සියලුම චංචල දේපල හා දැනට සමාගම සතු වෙනත් ස්ථානයක හෝ වෙනත් ගබඩාවක හෝ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා කලින් කලට හෝ කවර විටෙක ගබඩා කරනු ලබන හෝ කවරාකාරයකින් හෝ පවත්වාගෙන යනු ලබන කුමන අන්දමක වූ සියලුම යන්ත්‍රෝපකරන ඇතුළු සියලුම චංචල දේපල හා ඉහත සඳහන් ගබඩාවලට හා ස්ථානයට මතුවට කලින් කලට හෝ කවර විටෙක හෝ ගෙනෙන හා තබන හා මතුවට අළුතින් ගන්නා යන්ත්‍රෝපකරන, අමතර කොටස්, සවිකිරීම් හා උපාංග, මෙවලම්, විදුලි උපකරන ඇතුළු සියලුම චංචල දේපල හා සමාගම සිය ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා වෙනත් ස්ථානයක හෝ ස්ථානවල කලින් කලට හෝ කවර විටෙක රඳවා තබනු ලබන, ගෙනයනු ලබන යන්ත්‍රෝපකරන, අමතර කොටස් සවිකිරීම් හා උපාංග, මෙවලම්, විදුලි උපකරන ඇතුළු සියලුම චංචල දේපල

### දෙවැනි උපලේඛනය

පහත විස්තරවන නිශ්චල දේපලට ඇති සියලුම ආකාරයේ පූර්ණ අයිතිය, ඉල්ලීම බලපෑම භුක්තිය හා හිමිකම

මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ නම්වර C 911/34 යටතේ ලියාපදිංචි පිඹුරු අංක 5639 ට අනුව, බස්නාහිර පළාතේ, (මීගමුව ඉඩම් ලියා පදිංචි කිරීමේ කලාපය තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක - සීදුව නගර සභා සීමාව තුළ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, ලියනගේමුල්ල ග්‍රාමයේ, ඩී. පී. විමලසේන, බලයලත් මිනින්දෝරු විසින් 2005 දෙසැම්බර් 29 දාතමින් සකස් කළෙ (ඩී. පී. විමලසේන බලයලත් මිනින්දෝරු විසින් 2004 අප්‍රේල් 4 වැනි දාතමින් සකස් කළ පිඹුරු අංක 4946 යේ දැක්වෙන ලොට් අංක 4 හා ලොට් අංක 1, 3 හා ලොට් B වල කොටස් එකතුකොට නැවත මැන සකස් කළ) පිඹුරු අංක 5639 යේ ලොට් අංක 1 වශයෙන් පෙන්නුම් කරන කැකොල්කැලේ වත්ත (වඩාත් නිවැරිදි ලෙස කඩොල්කැලේවත්ත) ලෙස හඳුන්වන උතුරට : පිඹුරු අංක 4946 ලොට් අංක 1 කේ කොටසක් ද, නැගෙනහිරට : BOI ඉඩම ද දකුණට : පාර ද බස්නාහිරට : ප්‍රවේශ මාර්ගයෙන් ද මායිම් වන අක්කර එකයි රූඩ් එකයි පර්චස් 5.6 ක් වූ (අ. 1 රූඩ්. 1 පර්. 5.6) නොහොත් හෙක්ටෙයාර් බින්දුවයි දශම පහයි දෙකයි බින්දුවයි බින්දුවක් වූ (හෙක්ටෙයාර් 0.5200) වපසරියකින් යුත් මැන බෙදා වෙන්කළ ඉඩම.

### තුන්වැනි උපලේඛනය

දෙවන උපලේඛනයේ විස්තරාත්මකව විස්තර වන ඉඩමේ භූමියට හා එහි ගොඩනැගිලිවලට නිශ්චිත ලෙස සවිකර ඇති සියලුම යන්ත්‍ර, උපකරන, උපාංග හා සවිකිරීම් හා දෙවැනි උපලේඛනයේ විස්තරාත්මකව විස්තර වූ ඉඩමේ භූමියේ හා ගොඩනැගිලිවල නිශ්චිත ලෙස සවිකර ඇති පහත විස්තර වන සියලුම යන්ත්‍රෝපකරන හා මනා තත්වයෙන් මෙරටට ගෙන්වීමෙන් පසු දෙවැනි උපලේඛනයේ විස්තරාත්මකව විස්තර වූ ඉඩමේ භූමියේ හා ගොඩනැගිලිවල නිශ්චිත ලෙස මතුවට සවිකරනු ලබන සියලුම යන්ත්‍රෝපකරණ

මුද්‍රණ යන්ත්‍ර
ආලේපන යන්ත්‍රය
ජංගම උදුන
රෝලර් කටින් යන්ත්‍රය
ටොන් 10 යේ තෙරපුම් යන්ත්‍රය
ටොන් 40 යේ තෙරපුම් යන්ත්‍රය
වෑල්ඩින් මැෂිම
පෙට්ටි සාදන යන්ත්‍ර
දාර කපන යන්ත්‍ර
මහන යන්ත්‍ර
වාටි / දාර මහන යන්ත්‍ර
නවන යන්ත්‍ර
මිශ්‍රණ යන්ත්‍ර
අත් වෑල්ඩින් යන්ත්‍ර
විලර් යන්ත්‍රය
කපන යන්ත්‍රය
ටොන් 40 ගියර් ඇති තෙරපුම් යන්ත්‍රය
ටොන් 30 තෙරපුම් යන්ත්‍රය
ටොන් 20 තෙරපුම් යන්ත්‍රය
ටොන් 5 තෙරපුම් යන්ත්‍රය
දාර මිශ්‍රණය
විදුලි උදුන
රෝලර් කටින් යන්ත්‍රය

රෝලර් යන්ත්‍රය
පොම්ප කරන යන්ත්‍රය
බිඩිං යන්ත්‍රය
ප්‍රවාහන යන්ත්‍රය
අත් මිශ්‍රණය
තැටි මිශ්‍රණය
වෑල්ඩින් යන්ත්‍රය
ශීතකරණය
පීඩන යන්ත්‍රය
බල තෙරපුම් යන්ත්‍ර 08 යි
විදුලි මිශ්‍රණය
පොම්පය
රෝලින් යාන්ත්‍රණය
කම්බි කපන යාන්ත්‍රය
කම්බි කැපුම් ඉවත් කිරීමේ යන්ත්‍රය
රිවට් කිරීමේ යන්ත්‍රය

ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා බැංකුවේ ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක කමිටුවේ අණ පරිදි

ලේකම්,
ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩලය.

(බැංකු මුද්‍රාව තබන ලදී.)

දිනය : 2007 සැප්තැම්බර් මස 13 වැනි දින දී ය.

08-186

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනාව

එම්.ඒ.ටී.ආර්. ද සිල්වා සහ එම්. ඒ. එස්. ද සිල්වා
ගිණුම් අංක : 1025 5007 4645

2007 ජනවාරි මස 25 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුන රැස්වීමක දී මෙසේ විශේෂිත හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මාතලේ, පුල්ලෙයාර් කෝවිල පාරේ, අංක 22, "ජයසිරි" හි මිරිස්ස ආරච්චිගේ තුසිත රෝෂන් ද සිල්වා සහ මුදලිගේ අනුෂා සඳමාලි ද සිල්වා යන දෙදෙනා බන්ධනදායීන් වශයෙන් සහ ඉහත කී මාතලේ, පුල්ලෙයාර් කෝවිල පාරේ, අංක 22, "ජයසිරි" හි එකී මිරිස්ස ආරච්චිගේ තුසිත රෝෂන් ද සිල්වා යන අය උකස්කරු වශයෙන් මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් සී. බී. දෙහිගම විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ පිළිවෙලින් 2000 නොවැම්බර් 10 දාතම හා අංක. 33222 සහ 2002 අගෝස්තු 07 දාතම හා අංක 34964 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද උපලේඛනයේ වඩාත් මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2006 නොවැම්බර් 07 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දශලක්ෂ හතලිස්හතර දහස් දෙසියතිස්හතරකුත් ශත අසූපහක් (රු.1,044,234.85 ක් පමණයි) එකී ණය පහසුකම් මත හිඟව ඇති මුලු මුදල වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දසලක්ෂ හතලිස් හතර දහස් දෙසිය තිස් හතරකුත් ශත අසූපහක (රු.1,044,234.85 ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් හත්ලක්ෂ අනූහය දහස් හතලිස් අටකුත් ශත පනස් නවයක (රු.796,048.59 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දාහතයි දශම පහක් (17.5%) බැගින් 2006 නොවැම්බර් මස 08 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 33222 සහ 34964 දරන බැඳුම්කර මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මහනගර සභා සීමාව තුල නාගොල්ල පිහිටි දැනට වරිපනම් අංක 170 දරන මොයිසී ක්‍රෙසන්ට් කොටසේ (කටුවේගෙදර වත්තේ කොටසක්) නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. රංචාගොඩ විසින් සාදන ලද 1985 නොවැම්බර් මස 09 දාතම හා අංක 1428 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් නිරූපිත, මාතලේ ඉඩම් කාර්යාලයේ A 107/188 යටතේ ලියාපදිංචි කරන ලද උතුරට : එකී පිඹුරේ ලොට් 1 ද, නැගෙනහිරට : එම්. සී. පාරේ වරිපනම් අංක 168 දරන එම ඉඩමේම ඉතිරි කොටස ද සහ දකුණට හා බටහිරට : එම්. සී. පාර සහ එම්. සී. 2 වන පටුමගේ මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විසිහයයි දශම දෙකයි පහක් (අක්. 0 රූඩ් 0 පර්. 26.25) වන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ බිම් කොටස එහි පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

08- 368

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

බාරා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංක : 0031 1000 1451

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 පෙබරවාරි මස 25 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :-

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2005 නොවැම්බර් 28 දාතම හා අංක 810 දරන, හා සී. ජී. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 ඔක්තෝම්බර් 31 දාතම හා අංක 786 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛණයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ දිස්ත්‍රික්කයේ එහි ලියාපදංචි කාර්යාලය සහිතව එකී ජනරජයේ සමාගම් නීති යටතේ නිසිලෙස සංස්ථාගතකොට ඇති සමාගමක් වන ලියාපදිංචි අංක පීවී 9485 දරන බාරා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායීන් වශයෙන්ද පැහැරහැර ඇති හෙයින්ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහතුන් ලක්ෂ හැට අට දහස් හයසිය විසි හතයි ශත හතක (රු. 13,68,627.07) මුදලක් 2009 නොවැම්බර් මස 25 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද එකී රුපියල් දහතුන් ලක්ෂ හැට අට දහස් හයසිය විසි හතයි ශත හතක (රු. 13,68,627.07) මුදල ද 2009 නොවැම්බර් මස 26 වැනි දින සිට අංක 810 සහ 786 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එකොලොස් ලක්ෂ තිස් දෙදහස් නමසියයක (රු. 11,32,900) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි තුනක් (23%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 810 සහ 786 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නාලදී.

### උපලේඛණය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වලල්ලවිටි කෝරළේ බෙන්තොට ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ඉහල ග්‍රාමයේ ඉහල්ගොඩ පිහිටි වරිපනම් අංක. 18/21 දරණ "පනාවෙල කුඹුර නොහොත් දහයකණුවලග ගොව්පොල ලොට් 1 (පිඹුරු අංක. 640 ඒ දරණ පිඹුරේ නිරූපිත පනාවෙල කුඹුර කියනු ලබන)" හී ලොට් 2 යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. පී. ද සිල්වා යන අය විසින් සාදන ලද 1998 දෙසැම්බර් 07 දාතම හා අංක. 757 දරණ පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : ලොට් 3 සහ ලොට් 4 (කාණුව) නිරිතට : ලොට් 4 (කාණුව), වයඹට : එම ඉඩමේ ලොට් 1 සහ අම්බලන්ගොඩ සිට අළුත්ගම දක්වා පාර නිරිතට : එම ඉඩමේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොලහයි දශම බිංදුවයි එකක් (අ. 0, රූ. 0, පර්. 11.01 ) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාගී අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකි අංක, 757 දරණ පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව බී428/246 යටතේ බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

08- 367/19

---

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එම්. ටී. එස්. දමයන්ති
ගිණුම් අංක : 1082 5315 6081 / 0018 5001 6778

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ජුනි මස 24 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :-

සමාගම් ලියාපදිංචි අංක. පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2006 ජූලි 21 දාතම හා අංක. 1227 දරන, කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 ජනවාරි 19 දාතම හා අංක 4247 දරන, ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2007 අගෝස්තු 21 දාතම හා අංක 1670 දරන, හා සී.ජී. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 නොවැම්බර් 14 දාතම හා අංක 808 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මෙහෙරඹ තන්ත්‍රීගේ සුධර්මා දමයන්ති යන අය බන්ධනදායීන් වශයෙන්ද පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තිස් ලක්ෂ හතලිස් හතර දහස් දෙසිය අසූ එකයි ශත විසි එකක (රු.30,44,281.21) මුදලක් 2010 පෙබරවාරි 22 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් තිස් ලක්ෂ හතලිස් හතර දහස් දෙසිය අසූ එකයි ශත විසි එකක (රු.30,44,281.21) මුදලද 2010 පෙබරවාරි 23 දින සිට අංක 1127, 4247, 1670 සහ 808 දරණ එකී බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි තුන් ලක්ෂ දහතුන් දහස් අටසිය අසූ හයයි ශත තිස් තුනක (රු.23,13,886.33) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) හා තවත් රුපියල් දෙලක්ෂ හතලිස් එක් දහස් පන්සිය පනහක (රු. 2,41,550) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි හතරක් (24%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1127, 4247, 1670 සහ 808 දරණ එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 4 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නාලදී.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාවන් තුළ පන්නිපිටිය ග්‍රාමයේ පිහිටි "දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ.පී.අයි. සොයිසා යන අය විසින් සාදන ලද 1997 සැප්තැම්බර් 08 දාතම හා අංක. 189 A/97 දරණ පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 2A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට

මායිම්, උතුරට : වරිපනම් අංක 20/1 දරන පී. ඒ. ඩී. ධර්මසිරි යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ ලොට් 3, නැගෙනහිරට : ලොට් 3 සහ 2 B, දකුණට : ලොට් 2 B සහ ලොට් 1 සහ බස්නාහිරට : ලොට් 1 සහ පී. ඒ. ඩී. ධර්මසිරි යන අය විසින් හිමිකම් කියනු ලබන වරිපනම් අංක. 20/1 දරණ පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොලහයි දශම හතරයි තුනක් (A0 - R0 - P11.43) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාගී අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකි අංක, 189A/97 දරණ පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව M 2975/210 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාවන් තුළ පන්නිපිටිය ග්‍රාමයේ පිහිටි "දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ.පී.අයි. සොයිසා යන අය විසින් සාදන ලද 1997 සැප්තැම්බර් 08 දාතම හා අංක. 189 A/97 දරණ පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 2B වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 2A, නැගෙනහිරට : ලොට් 3 සහ නිවෙස් වලට පාර දකුණට : නිවෙස් වලට පාර සහ ලොට් 1 සහ බස්නාහිරට : ලොට් 1 සහ ලොට් 2A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් බිංදුවයි දශම හතයි හතරක් (අ. 0, රූ. 0, පර්. 0.74) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාගී අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකි අංක, 189A/97 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව M 2975/214 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය :-

නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව M 2340/43 යටතේ ලියාපදිංචි කොට ඇති හා බලයලත් මානකතැන ඒ. පී. අයි. සොයිසා යන අය විසින් සාදන ලද 1997 සැප්තැම්බර් 08 දාතම හා අංක 397 දරණ පිඹුරේ ලොට් 5 (මාර්ග වෙන්කිරීම).

අධ්‍යක්ෂ මණඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

08- 367/18

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ජී.එල්.ජේ.සී. මෙන්ඩිස් සහ පී.ඩී.බී.ඒ ප්‍රියන්ති
ගිණුම් අංක : 1044 5317 9198

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ජුනි මස 24 වෙනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :-

සමාගම් ලියාපදිංචි අංක. පීකිව් 144 දරණ සම්පත් බැංකුව පීඑල්සී නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 ඔක්තෝම්බර් 18 දාතම හා අංක. 1597 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛණයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගම්මැද ලියනගේ ජෙරාඩ් කැමිලස් මෙන්ඩිස් සහ පින්ගමගේ දෝන බර්නි ඇනට් ප්‍රියන්ති යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී ගම්මැද ලියනගේ ජෙරාඩ් කැමිලස් මෙන්ඩිස් උකස්කරු වශයෙන් ද පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හාර ලක්ෂ අට දහස් හයසිය අනූ තුනයි ශත හැත්තෑ හතරක (රු. 4,08,693.74) මුදලක් 2010 මැයි 10 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද එකී රුපියල් හාර ලක්ෂ අට දහස් හයසිය අනූ තුනයි ශත හැත්තෑ හතරක (රු.4,08,693.74) මුදලද 2010 මැයි 11 දින සිට අංක 1597 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් ලක්ෂ අසූ තුන් දහස් දහ අටයි ශත තිස් පහක (රු.3,83,018.35) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1597 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නාලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛණයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී.කේ.ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරි ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නාලදී.

### උපලේඛණය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වල්ගම්පත්තු කෝරළේ දේවමැදි හත්පත්තුවේ වාරියපොල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පබ්බෝව පිහිටි "බොරළුවලගාව හේන දැන් වත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආරියදාස අතපත්තු යන අය විසින් සාදන ලද 1997 ජනවාරි 30 දාතම හා අංක 17/97 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : රජයට අයිති වැව, නැගෙනහිරට : රජයට අයිති වැව, දකුණට : මාෂල් මෙන්ඩිස් විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : කඩහපොල සිට රඹවැව දක්වා ප්‍රධාන පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විසි දෙකයි දශම පහක් (අ. 0. රූ. 2, පර්. 22.5 ) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාගී අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකි අංක 17/97 දරණ පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D1320/85 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වල්ගම්පත්තු කෝරළේ දේවමැදි හත්පත්තුවේ වාරියපොල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පබ්බෝව පිහිටි "කොලොන්ගහමූලහේන නොහොත් දැන් වත්ත වශයෙන් හඳුන්වන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන ආරියදාස අතපත්තු යන අය විසින් සාදන ලද 2007 දෙසැම්බර් 17 දාතම හා අංක 171/2007 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ජෙරාඩ් කැමිලස් මෙන්ඩිස් විසින් හිමිකම් කියනු ලබන ඉඩම නැගෙනහිරට : රජයට අයිති වැව, දකුණට : මෙහි ලොට් 2 සහ බස්නාහිරට : කඩහපොල සිට රඹවැව දක්වා ප්‍රධාන පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හතරක්

(අ. 0, රූ. 0, පර්. 24 ) හෝ හෙක්ටෙයාර 0.0607 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 171/2007 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ උප බෙදුමකි :-

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වල්ගම්පත්තු කෝරලේ දේවමැදි හත්පත්තුවේ වාරියපොල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පබ්බෝව පිහිටි "කොලොන්ගහමුලහේන නොහොත් දැන් වත්ත වශයෙන් හඳුන්වන" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආරියදාස අතපත්තු යන අය විසින් සාදන ලද 1995 ජූලි 23 දාතම හා අංක 88/95 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ජෙරාඩ් කැමිලස් මෙන්ඩිස් විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : පබ්බෝව වැව, දකුණට : මෙහි ලොට් 2 සහ බස්නාහිරට : කඩහපොල සිට රඹවැව දක්වා ප්‍රධාන පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විසිනවයක් (අ. 0, රූ. 2, පර්. 29) හෝ හෙක්ටෙයාර 0.0607 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 171/2007 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D1138/271 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

08- 367/17

---

## මහජන බැංකුව - උයන්වත්ත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඩී" වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඩී" වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

මාතර ප්‍රසිද්ධ නොතාරිස් මහගමගේ චූලාංගනී අරෝෂිනී විසින් සහතික කරන ලද 2004.08.07 දිනැති අංක : 229දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් අඹවත්ත හේවාගේ විජයානන්ද සහ ගරුසිංහගේ ෂෙනරින් පත්මා අයිරාංගනී අය විසින් පැහැර හැර ඇති එකී උකස්කරය අංක 229 යටතේ රුපියල් දෙලක්ෂ හැත්තෑ දහස් එකසියය (රු. 2,70,100) ක මුදලක් මහජන බැකුංවට අය වීමට ඇති බැවින් ද, 2006.02.27 දින සිට වර්ෂයකට සියයට විසි හය (26%) බැගින් රුපියල් දෙලක්ෂ හැත්තෑ දහස් එකසියය (රු. 2,70,100) ක මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29 "එල්" වගන්තිය යටතේ අය කර ගනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව රුපියල් දෙලක්ෂ හැත්තෑ දහස් එකසියය (රු. 2,70,100) ක මුදල අය කර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 229 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඩී" වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපල පිළිබඳ විස්තර

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගඟබඩ පත්තුවේ දෙවිනුවර පිහිටි ඊශ්වරගේ වත්ත නොහොත් බොරලැස්සගෙ වත්ත සහ දුඹුටුවාකන්දහේන යන ඒකාබද්ධ ඉඩමෙන් බෙදා වෙන් කළ අංක 04 දරන ඉඩම් කැබැල්ල බෙදූ අංක 01 දරන ඉඩම් කැබැල්ල හා එම ඉඩමේ අංක 04 දරන කැබැල්ලේ ඉතිරි කොටස බෙදූ අංක 01 දරන කැබැල්ල ඒකාබද්ධ කරමින් 2007.11.14 දිනැති කේ. සිරිවර්ධන බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 1153/2007 දරන පිඹුර ප්‍රකාර අංක 1ඒ වශයෙන් පිළිබිඹු වන ඉඩම් කැබැල්ලට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : මෙම ඉඩමේ අංක 03 දරන කැබැල්ල ද, නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 07 හා 08 දරන කැබැලි ද, දකුණට : මෙම ඉඩමේ අංක : 02 දරන කැබැල්ල හා මෙම ඉඩමේ කොටසක් ද, බස්නාහිරට : දෙවිනුවර සිට තල්පාවිලට යන පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසි දෙකක් (අක්. 0, රූ. 0, පර්. 22) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සෑම සියලු දෙය ද වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 673/31 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු - මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය කාර්යාලය,
අංක 215, අනගාරික ධර්මපාල මාවත,
මාතර.

08-311

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

ආර්. ඒ. ඩී. දුෂන්ත
ගිණුම් අංක : 1004 5050 5875

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ජූනි මස 24 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :-

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. එන්. එම්. කෝදාගොඩ යන අය විසින් ලියා සහතික කරන ලද 2008 ජූලි 21 දාතම හා අංක 814 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන්

ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රණසිංහ ආරච්චිගේ දුලිප් දුෂන්ත යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දස ලක්ෂ අනූ නම දහස් අටසිය තිස් හතයි ශත තිස් එකක (රු. 10,99,837.31) මුදලක් 2010 අප්‍රේල් 05 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් දස ලක්ෂ අනූ නම දහස් අටසිය තිස් හතයි ශත තිස් එකක (රු. 10,99,837.31) මුදලද 2010 අප්‍රේල් 06 දින සිට අංක 814 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් නම ලක්ෂ හැට නම දහස් නමසිය අනූ හයයි ශත පනස් දෙකක (රු. 9,69,996.52) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි එකක් (21%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 814 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදාන කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කොළඹ මහ නගර සභා සීමාවන් තුළ වෝඩ් අංක 38 බම්බලපිටියේ පිහිටි කොල්ලුපිටිය පටුමගේ වරිපනම් අංක බිම් මහල 77/1- 77/16, පළමු මහල 77/17 - 77/32, දෙවෙනි මහල 77/33- 77/48, තෙවැනි මහල 77/49 - 77/64 දරන, බලයලත් මානක තැන පී.ඩබ්ලිව්. පතිරණ යන අය විසින් සාදන ලද 1982 ජූනි මස 21 දාතම හා අංක 186 දරන පිඹුරේ නිරූපිත ඒකක 64 කින් සමන්විත කොල්ලුපිටිය ෆ්ලැට්ස් යයි කියනු ලබන ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අබ්දුල් කෆීර් මාවත වරිපනම් අංක 36 සහ 40/1 දරන පරිශ්‍රයන්, නැගෙනහිරට : කොල්ලුපිටිය පටුමගේ වරිපනම් අංක 80 සහ 85/1 - 85/7 දරන පරිශ්‍රයන්, දකුණට : කොල්ලුපිටිය පටුමග සහ බස්නාහිරට : කොල්ලුපිටිය පටුමගේ වරිපනම් අංක 71 දරන පරිශ්‍රයන් සහ ආර්. ඒ ද මෙල් මාවත වරිපනම් අංක 279 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් විසි අටයි දශම තුනයි අටක් (අක්. 0, රූ. 1, පර්. 28.38) හෝ හෙක්ටයාර 0.17548 ක් විශාල ඉඩම් කොටස සමග සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 186 දරන පිඹුරට අනුවය.

### දෙවැනි උපලේඛනය

එකී පිඹුරේ පිටු අංක 06හි දක්වා ඇති CE1 CE3, CE15 වශයෙන් ලකුණු කොට ඇති පොදු ප්‍රදේශවලට ආසන්නතම පිවිසුමක් සහිත හා පදිංචි නිවෙස් වශයෙන් භාවිතා කරනු ලබන හා කොල්ලුපිටියේ ෆලැට්ස් හි තෙවැනි මහලේ පිහිටි එකී වෝඩ් අංක 38 හි බම්බලපිටිය, කොල්ලුපිටිය පටුමගේ වරිපනම් අංක 77/50, දරන 1982 ජූනි 21 දාතම හා අංක 186 දරන එකී තට්ටු නිවාස සංකීර්ණ පිඹුරේ පිටු අංක 06 හි නිරූපිත අංක 50 වශයෙන් ලකුණු කොට ඇති තට්ටු නිවාස සංකීර්ණ ඒකකයට මායිම්, උතුරට : ඒකක අංක 51 න් මෙම ඒකකය වෙන්වන බිත්තියේ මැද, නැගෙනහිරට : CE12 ඉඩමේ ඉතිරි කොටසේ ඉඩ ප්‍රමාණයෙන් මෙම ඒකකය වෙන් කරන බිත්තියේ මැද, දකුණට : ඒකක අංක 49 න් මෙම ඒකකය වෙන්වන බිත්තියේ මැද සහ බස්නාහිරට : CE15 බැල්කනි පිවිසුමෙන් මෙම ඒකකය වෙන්වන බිත්තියේ මැද සහ මුදුන (හිස්) (Zenith) සීලිම සහ නිරීක්ෂකයාගේ හිසට විරුද්ධ දිශාවෙහි (පා පස) අග (Nadir) තුන්වෙනි මහලේ බිම මැද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් වර්ග අඩි පන්සිය හැටක් (560 sq. ft) විශාල ප්‍රමාණය එකී අංක 186 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව Con A 123/10 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

### තෙවන උපලේඛනය

*පොදු මූලිකාංග :*

1. ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම ;
2. පහල මහල් පිඹුරේ CE12 වශයෙන් ලකුණු කොට ඇති ඉඩමේ ඉතිරි කොටස ;
3. මෙම ගොඩනැගිල්ලේ අත්තිවාරම්, කණු, මුක්කු, ප්‍රධාන බිත්ති සහ වහල ;
4. CE1- CE3 වශයෙන් ලකුණු කොට ඇති බිම් මහලේ 1 වන 2 වන සහ 3 වන මහල් වල තරප්පුපෙලවල් ;
5. CE4 සහ CE5 වශයෙන් ලකුණු කොට ඇති ජල කුළුණු (බිම් මහලේ) ;
6. CE6 CE7 සහ CE8 වශයෙන් ලකුණු කොට ඇති කුණු කසල කාමරය ;
7. CE9 වශයෙන් ලකුණු කොට ඇති පොම්පාගාරය ;
8. CE10 වශයෙන් ලකුණු කොට ඇති කාර්යාල කාමරය සහ CE11 වශයෙන් ලකුණු කොට ඇති වැසිකිලිය (Latrine) ;
9. CE13, CE14 සහ CE15 වශයෙන් පිළිවෙලින් ලකුණු කොට ඇති 1 වැනි 2 වැනි සහ 3 වැනි මහල් වල බැල්කනි පිවිසුම ;
10. විදුලිය, දුරකථන, වායුසමීකරණ, ගෑස්, ජලය, මලාපවහන, ජලාපවහන සහ පොදු භාවිතය සඳහා පවත්නා සියලුම උපකරණ (Apparatus) සඳහා වන ස්ථාපිත කිරීම් ;
11. එහි පැවැත්මට, නඩත්තුවට සහ ආරක්ෂාවට පහසුකම් සැළසීමටත් හා සාමාන්‍ය පොදු භාවිතයටත් අවශ්‍ය මෙම දේපළේ අනෙකුත් සියලුම අංග සහ පහසුකම්.

පොදු මූලිකාංගයන් හි කොටස සියයට ප්‍රමාණයෙන් 1/64% කි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-367/15

---

### සම්පත් බැංකුව පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුවේ පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

පී. බී. ආර්. ජේ. දිසානායක.
ගිණුම් අංක : 1001 5064 0282.

2007 මාර්තු මස 29 වැනි දින සම්පත් බැංකුවේ පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පන්නිපිටිය, ඇරැව්වල අංක 497/2 දරන ස්ථානයේ පදිංචි පහල බරුවත්ත රාලලාගේ

ජයතිස්ස දිසානායක යන අය බන්ධනාදායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එච්. කණ්ඩම්බි විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2003 ජූලි මස 31 දාතම හා අංක 2023 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැර ඇති හෙයින් 2007 ජනවාරි මස 02 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දෙලක්ෂ අනූ අට දහස් තුන්සිය තිහකුත් ශත අටක (රු. 2,98,330.08ක් පමණයි) මුදලක් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් දෙලක්ෂ අනූඅට දහස් තුන්සිය තිහකුත් ශත අටක (රු. 2,98,330.08ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් දෙලක්ෂ අසූහත් දහස් අනූ අටකුත් ශත තුනක (රු. 2,87,098.03ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දාහතර (14%) බැගින් 2007 ජනවාරි මස 03 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමඟ, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අය කර ගැනීම සඳහා එකී අංක 2023 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් උකස් තබන ලද දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුල සල්පිටි කෝරලේ පල්ලෙ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත ඇරැව්වල පිහිටි පහළවත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න විසින් සාදන ලද 1998 ජූලි මස 10 දාතම හා අංක 2159 දරන පිඹුරේ ලොට් B 2 B වශයෙන් ලකුණු කොට නිරූපිත ගල්කිස්ස ඉඩම් කාර්යාලයේ M 2351/246 හි ලියාපදිංචි කර ඇති එකී අංක පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් අටක් (අක්. 0, රූඩ්. 0, පර්. 8) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවක් දෙකයි බිංදුවයි දෙකක් (හෙක්. 0.0202) වන උතුරට : අංක 2159 පිඹුරේ ලොට් B 2 A ද, නැගෙනහිරට : වීරෝදාර මාවත ද, දකුණට : පාර ද සහ බටහිරට : එම ඉඩමේ ම ලොට් A ද මායිම් වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොල වගාවන් හා ගොඩනැගිලි ද සමග සහ මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-367/16

---

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යෝජනා සම්මුතිය

ගණුදෙනුකරුගේ නම : එස්. ජී. ප්‍රොජෙක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

වර්ෂ 2010ක් වූ අප්‍රේල් මස 27 වැනි දින පවත්වන ලද පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකමතිකව ද පහත දැක්වෙන පරිද්දෙන් යෝජනා සම්මත කර ගන්නා ලදී.

කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් නම් කරන ලද ලියාපදිංචි අංක පීකිව් 48 දරන පෑන් ඒෂියා බෑංකිං කෝපරේෂන් පීඑල්සී නමින් වූ , කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. අයි. සමරසිංහ විසින් සහතික කරන ලද වර්ෂ 2001ක් වූ ජනවාරි මස 05 වැනි දිනැති අංක 1001 දරන උකස් බැඳුම්කර මත ගෙවිය යුතු ගෙවීම් සිදු කිරීම එස්. ජී. ප්‍රොජෙක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් ද (බන්ධනදායිගේ අධ්‍යක්ෂවරයකු වූ) ප්‍රියන්ත මලිඳුව පතිරණ උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස් බැඳුම්කරයන් මත,

(අ) වර්ෂ 2010ක් වූ මාර්තු මස 04 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් මිලියන එකසිය දහඅටයි, එක්ලක්ෂ හතලිස් තුන් දහස් දෙසිය අසූ හයකුත් ශත අසූ තුනක් (රු. 11,81,43,286.83) වූ මුදලක් ද වර්ෂ 2010ක් වූ මාර්තු මස 05 වැනි දින සිට එකී උකස් බැඳුම්කරය මත, ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් විසිතුන් මිලියන තුන්ලක්ෂ අසූ අටදහස් එකසිය විස්සක (රු. 2,33,88,120) ක මුදල මත වාර්ෂිකව සියයට 27.5%ක් වූ පොළිය ද,

(ආ) වර්ෂ 2010ක් වූ මාර්තු මස 04 වැනි දින දක්වා මුල් මුදල සහ පොළී වශයෙන් රුපියල් පන්ලක්ෂ හතලිස් තුන්දහස් එකසිය අසූ එකයි ශත විස්සක් (රු. 5,43,181.20) වන මුදලක් ද, වර්ෂ 2010 ක් වූ මාර්තු මස 05 වැනි දින සිට එකී උකස් බැඳුම්කරය මත, ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් පන්ලක්ෂ හතලිස් තුන්දහස් එකසිය අසූ එකයි ශත විස්සකට (රු. 5,43,181.20) ක මුදල මත වර්ෂයකට සියයට 25%ක් වූ පොළිය ද,

(ඇ) වර්ෂ 2010 ක් වූ මාර්තු මස 04 වැනි දින දක්වා මුල් මුදල සහ පොළී වශයෙන් රුපියල් එකොලොස් දහස් නවසිය අනූහතයි ශත හතලිහක් (රු. 11,997.40) වන මුදලක් ද වර්ෂ 2010 ක් වූ මාර්තු මස 01 වැනි දින සිට එකී උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් එකොලොස් දහස් නවසිය අනූ හතකුත් ශත හතලිහකට (රු. 11,997.40)ක මුදල මත වර්ෂයකට සියයට 29%ක් වූ පොළිය ද,

(ඈ) වර්ෂ 2010 ක් වූ මාර්තු මස 04 වැනි දින දක්වා මුල් මුදල සහ පොළී වශයෙන් රුපියල් පහළොස් දහස් නවසිය හැට හයකුත් ශත හැත්තෑ පහක (රු. 15,996.75) මුදලක් ද වර්ෂ 2010 ක් වූ මාර්තු මස 01 වැනි දින සිට එකී උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් පහළොස් දහස් නවසිය හැට හයකුත් ශත හැත්තෑ පහක (රු. 15,966.75) ක මුදල මත වර්ෂයකට සියයට 29% ක් වූ පොළිය ද,

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ, ඒ කෙසේද යත්

අංක 1001 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් එකසිය දහඅට මිලියන හත්ලක්ෂ දහහතර දහස් හාරසිය තිස් දෙකකුත් ශත දහ අටක් (රු. 11,87,14,432.18) වන මුදල ද, ඉහත කී දින සිට වෙන්දේසියේ දින දක්වා පොළිය ද, එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි

වගන්තිය යටතේ අයකර ගත හැකි වියදම් සහ මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති බැංකුවට උකස් තබන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ බැද්දගාන පාරේ, අංක 134 දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර පී. කේ. ඊ. සේනාපතිට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාරව අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඳුබඩ පත්තුවේ, පණනවෙල පිහිටි (අංක ටීපී 191851, 298021 සහ 298013 දරන පිඹුරුපත්වල දක්වා ඇති) එකිනෙකට යාව සහ ඒකාබද්ධ කොට තිබෙන හම්පැළැන්දගහහේන, තැන්නහේන, කෝන්ගහහේන, කොස්වත්තහේන සහ තිරුවානකැටිය නමැති බෙදු සීමා මායිම් දක්වා ඇති ලොට් ඒ දරන ඉඩම් කට්ටිය සහ එහි පිහිටා ඇති ගල්වල සහිත වූ ද, උතුරට : බඩේබැද්දේ ගම (එෆ්වීපී 178) සහ මිල්ල ගම (එෆ්වීපී 174) ද, නැගෙනහිරට : කන්කානම්ගේවත්ත, ජූල්ගහවත්ත සහ මහෙවත්ත ද, දකුණට : මෙම ඉඩමේ ලොට් බී දරන ඉඩම් කට්ටියෙන්, පින්දෙනිය හෙවත් පින්හේන, ලියනගහවත්තෙන් සහ ජූල්ගහවත්තෙන් ද, බස්නාහිරට : නයාවැටුනගලහේන (ටීපී 207949) මුත්තෙට්ටුහේනෙන් මායිම් වූ බලයලත් මිනින්දෝරු ඩී. එස්. රාජපක්ෂ විසින් පිළියෙල කරන ලද වර්ෂ 1938ක් වූ අගෝස්තු මස 05 වැනි දිනැති අංක 21ඒ දරන පිඹුරේ දක්වා ඇත්තා වූ ද මාතර දිසා අධිකරණයේ අංක 10746 දරන නඩුවේ ගොනු ගත කර ඇත්තා වූ ද මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 412/87 සහ ඊ 396/152 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද ප්‍රමාණයෙන් අක්කර දොළහයි රූඩ් දෙකයි, පර්චස් විසි පහකුත් දශම දෙකයි පහක් (අ. 12, රූ. 2, පර්. 25.25) වන ඉඩම වේ.

2. ඉහත කී පරණවෙල පිහිටි එකට යාවූ සහ ඒකාබද්ධ කොට තිබෙන ගම්පැළඳගහහේන, තැන්නහේන, කෝන්ගහහේන, කොස්වත්හේන සහ තිරුවානකැටිය නමැති බෙදු සීමා මායිම් දක්වා ඇති ලොට් "බී" දරන ඉඩම් කට්ටිය සහ එහි පිහිටි ගල්වල සහිත වූ ද, උතුරට : වලකඩේවත්ත, අව කනත්තවත්ත ද, නැගෙනහිරට : ලන්දෙවත්ත, වවුලංගහහේන සහ ලියන්ගහහේන ද, දකුණට : ලියංගහහේන, වෙහෙරහේන නොහොත් තැන්නපිටහේන සහ බස්නාහිරට : හංගාරේමහහේන ද මායිම් වූ අංක ටීපී 271356 දරන පිඹුරේ දැක්වෙන සහ අංක 21ඒ දරන ඉහත කී පිඹුරේ දැක්වෙන මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 412/88 සහ ඊ 396/153 යටතේ ලියාපදිංචි කර තිබෙන ප්‍රමාණයෙන් අක්කර දොළහයි රූඩ් දෙකයි පර්චස් විසිපහයි දශම දෙකයි පහක් වූ (අ. 12, රූ. 2, පර්. 25.25) ද ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමනාකරු-අයකර ගැනීම්.

08-363

---

## සම්පත් බැංකුව පීඑල්සී
(කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින් වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ඩී. සුමතිපාල.
ගිණුම් අංක : 0001 5018 3669.

2006 පෙබාරවාරි මස 23 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වැල්ලම්පිටිය, වෙන්නවත්ත, අංක 141/1හි දෙද්දුවගේ සුමතිපාල යන අය බන්ධනදායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. කේ. ගමලත් විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2005 පෙබරවාරි මස 03 දාතම හා අංක 704 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2005 දෙසැම්බර් මස 13 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දාහතර ලක්ෂ අසූදෙදහස් පනහකුත් ශත අනූවක (රු. 14,82,050.90) මුදලක් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින්, එකී රුපියල් දාහතර ලක්ෂ අසූදෙදහස් පනහකුත් ශත අනූවක (රු. 14,82,050.90) සම්පූර්ණ හිඟ මුදල ද, තවත් රුපියල් දහතුන් ලක්ෂ අනූ දෙදහසක (රු. 13,92,000) මුදල සඳහා වසරකට සියයට දොළහයි දශම පහ (12.5%) බැගින් 2005 දෙසැම්බර් මස 14 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 704 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස්තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දකුණ අඹතලෙන් පහළ, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ වෙන්නවත්තේ පිහිටි සඳහම් මාවත, වරිපනම් අංක 23 දරන වරක දෙල්ගහවත්ත සහ වරක දෙල්වත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1998 මැයි මස 06 දාතම හා අංක 4741 දරන පිඹුරේ ලොට් A වශයෙන් ලකුණු කොට නිරූපිත උතුරට : සඳහම් මාවත ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එස්. එච්. පීරිස් විසින් සාදන ලද අංක 2510 පිඹුරේ ලොට් 21A ද, දකුණට : බලයලත් මිනින්දෝරු එස්. එච්. පීරිස් විසින් සාදන ලද අංක 2510 පිඹුරේ ලොට් 21A ද, සහ බටහිරට : පී. විතානගේ ගේ ඉඩම ද, මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමග.

එකී ලොට් A බිම් කොටස පහත විස්තර කෙරෙන ඉඩමේ ප්‍රතිමිනුමකි.

ඉහත කී වෙන්නවත්තේ පිහිටි වරක දෙල්ගහවත්ත සහ වරක දෙල්වත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එච්. එම්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1967 ජූලි 06 දාතම හා අංක 4071 දරන පිඹුරේ ලොට් 22 වශයෙන් ලකුණු කොට නිරූපිත කොළඹ ඉඩම් කාර්යාලයේ B 817/291හි ලියාපදිංචි කොට ඇති උතුරට : පාර සහ කණ්ඩිය ද, නැගෙනහිරට : ලොට් 21 ද, දකුණට : ලොට් 21 ද සහ බටහිරට : එම ඉඩමේ කොටසක් වන එන්. ජේ. කුරේගේ ඉඩම ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලුම දේ සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-370/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.